වාර්ෂික වාර්තාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

Annual Report

Uva Wellassa University

ஆண்டறிக்கை

ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்

2015

Uva Wellassa University
Passara Road
Badulla.

www.uwu.ac.lk

දැක්ම

සෞභාගයය හා යහපැවැත්ම සාක්ෂාත් කර ගනු පිණිස පිබිද එන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර තුළ දැනුම, තාක්ෂණයන්, තිරසාර නිෂ්පාදන පිළිවෙත් හා ක්‍රියාවලීන්, ව්‍යවසායකත්වය, තිරසාර කළමනාකරණ පිළිවෙත් හා ක්‍රියාවලීන් යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම නිර්මාණය කිරීම හා ප්‍රචලිත කිරීම හරහා ජාතික සම්පත්වලට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත් වීම.

මෙහෙවර

ආර්ථික ක්‍රියාකාරිත්වයට අගය එක් කිරීම මඟින් ජාතික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයන් ලබා දීම පිණිස උචිත දැනුමෙන්, අත්‍යවශ්‍ය කුසලතා වලින්, ව්‍යවසායකත්ව හැකියාවන් ගෙන්, සාරධර්ම වලින් හා ආකල්පයන් ගෙන් හෙබි සැමතින් පරිපූර්ණ හා පූර්ණ වශයෙන් රැකියා නියුක්ත කළ හැකි තාක්ෂණ තාන්ත්‍රික හා ව්‍යවසායික උපාධිධාරීන් බිහි කිරීම

විශ්වවිද්‍යාලයේ පරමාර්ථ

මෙම විශ්වවිද්‍යාලයේ පරමාර්ථ එහි ආරම්භයේ සිටම නිශ්චිතව දක්වා ඇති අතර ඒවා පහත සඳහන් වේ:

1. මෙම විශ්වවිද්‍යාලය ප්‍රමුඛතම තාක්ෂණයෙන් යුක්ත උත්කෘෂ්ට යටිතල පහසුකම් ද සමගින් අධ්‍යයන කටයුතු සඳහා හිතකාමී සැලසුම් සහගත විශ්වවිද්‍යාලය බවට සංවර්ධනය වීමට ඉලක්ක කෙරේ. අතිනවීන ඉගැන්වීම් ආධාරක වලින් හා සන්නිවේදන මෙවලම් වලින් සමන්විත දේශනාගාර, පරිපූර්ණ ලෙස ගෘහ භාණ්ඩ වලින් හා උපකරණ වලින් සන්නද්ධ විද්‍යාගාර සංකීර්ණ සහ සියලු අංගෝපාංගයන් වලින් සමන්විත පුස්තකාලයක් සංවර්ධනය කිරීමෙන් මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට ඉලක්ක කෙරෙනු ඇත.

2. අගය එක් කිරීම කෙරෙහි බලවත් අවධාරණයක් ද සහිතව, ආර්ථික සංවර්ධනයට අදාළත්වයක් ඇති විෂයන්ගේ සුවිශේෂී සංකලනයක් සහිතව නව පුළුල් පරාසයක පැතිරුණු වැඩ සටහන් හඳුන්වා දීම - මෙම විශ්වවිද්‍යාලය උපාධි වැඩසටහන් වල ප්‍රමිතිය ද පවත්වා ගනිමින්, ආර්ථික සංවර්ධනයට හා අගය එක් කිරීමට අදාළ වන්නා වූ නව උපාධි වැඩ සටහන් කලින් කලට හඳුන්වා දෙනු ඇත.

3. විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම පුළුල් පරාසයක අධ්‍යාපනය, අත්‍යවශ්‍ය කුසලතා සහ ව්‍යවසායකත්ව නිපුණතා ලබා දෙමින්, ඔවුන් සමාජයේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිපූර්ණ උපාධිධාරීන් බවට පත්කිරීම.

4. මෙම විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල පනතේ නියමයන්ට අනුකූල වන අතරම, විශ්වවිද්‍යාලය එහි දැක්ම කරා නවීන ප්‍රවේශයකින් යුතුව මෙහෙයවනු පිණිස, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියෙහි ඇති සාම්ප්‍රදායික දැනුම ඉමෙන් මිදී, බහු විෂයය-ක්ෂේත්‍රීය ස්වභාවයේ උපාධි වැඩ සටහන් සංවර්ධනය කරනු ඇති අතර මෙම වැඩ සටහන් සඵලදායී ලෙස පිරිනමනු පිණිස නව්‍ය හා සුනම්‍ය යාන්ත්‍රණ භාවිතා කරනු ඇත. පීඨ මණ්ඩල හා සනාතන සභාව පාඨමාලා කමිටු වලට පහසුකම් සලස්වන අතර, කථිකාචාර්යවරුන් අනුයුක්තව සිටින අධ්‍යයනාංශ නොතකා සියලුම උපාධි වැඩ සටහන් සඳහා ඔවුහු පොදු සම්පතක් වශයෙන් හවුලේ දායක වෙති.

5. ජාතික ආර්ථික පරමාර්ථ වලට උචිත ප්‍රධාන අභිමතාර්ථ ඔස්සේ පර්යේෂණය හා සංවර්ධනය සිදු කෙරෙන අතර ප්‍රධාන අභිමතාර්ථ තුනක් වටා පර්යේෂණ කළඹ ගොඩනැංවීම - එබඳු පර්යේෂණ මත පදනම්ව ඉගෙනුම් කටයුතු ප්‍රගමණය කිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල අභිලාෂයන්ට ප්‍රමුඛත්වය දෙමින් දැනුම ගොඩනැගීම සිදුකෙරෙන අතර, වැඩිදුර පර්යේෂණ හා අගය එක් කිරීම අවශ්‍ය ක්ෂේත්‍රයන් හඳුනා ගැනෙනු ඇත.

6. උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, විශේෂඥතා, සංස්ථායික හා අඛණ්ඩ අධ්‍යාපන වෙළඳපල රිද්මය ස්පර්ශ කරමින් ඔවුන්ගේ ඉල්ලුමට සරිලන පරිදි වැඩ සටහන් නවීකරණය හා සංවර්ධනය කෙරෙනු ඇත.

7. උසස්ම ගණයේ අධ්‍යයන විශිෂ්ටත්වයක් සහිතව සංවිධානමය මූලධනය සංවර්ධනය කෙරෙන පරිසරයක් ඇති කිරීම හා පවත්වා ගෙන යාම - මින් ගම්‍ය වනුයේ අපි උසස් ගණයේ ව්‍යවසායික නායකත්වයක්, බහු විෂයය ක්ෂේත්‍රීය කණ්ඩායම් හා සුවිශේෂී සංවිධානමය සංස්කෘතියක් සහිතව අපගේ සංවිධානමය මූලධනය සංවර්ධනය කරන බවයි.

8. සියලුම කේන්ද්‍රික නොවන ක්‍රියාකාරකම් සඳහා ආදර්ශමත් ප්‍රසම්පාදකයකු බවට පත්වීම හා කේන්ද්‍රික ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සේවයේ යොදවන්නකු බවට පත්වෙමින්, ඔවුන් විශ්වවිද්‍යාලයේ මෙහෙවර ඉටුකරනු පිණිස බලගැන්වීම - මෙම විශ්වවිද්‍යාලය මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගනු පිණිස අද්විතීය, ජවසම්පන්න, කැපවීමෙන් යුතු හා කුසලතා පූර්ණ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් බඳවා ගනී.

පටුන

දැක්ම			i
මෙහෙවර			i
විශ්වවිද්‍යාලයේ පරමාර්ථ			ii
1		**උප කුලපතිතුමාගේ සමාලෝචනය**	1
2		**පාලක සභාව සහ සනාතන සභාව**	5
	2.1	පාලක සභාව - 2015	5
	2.2	සනාතන සභාව - 2015	6
3.		**සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**	7
4.		**ශිෂ්‍යය කටයුතු**	8
	4.1	ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ සහ මානව සම්පත්	9
	4.2	ශිෂ්‍යය ශිෂ්‍යයාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර	9
	4.2.1	ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා නව ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ	10
	4.2.2	ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා නව ඇතුළත්වීම් - විදේශීය ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ	10
	4.3	උපාධි ප්‍රදානය - 2015	11
	4.4	නේවාසිකාගාර	12
	4.4.1	විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර	12
	4.4.2	කුලියට ගනු ලැබූ නේවාසිකාගාර	13
	4.5	ශිෂ්‍යත්ත්ව	13
	4.5.1	2015 වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්ත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර	13
	4.5.2	2015 වර්ෂයේ වෙනත් ශිෂ්‍යත්ත්ව පිළිබඳ විස්තර	14
5.		**මානව සම්පත්**	15
	5.1	අධ්‍යයන කාර්යය මණ්ඩලය	16
	5.2	පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය	16
	5.3	අධ්‍යයන උපකාරක හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව	17
	5.4	අනධ්‍යයන කාර්යය මණ්ඩලය බෙදී ගොස් ඇති ආකාරය	18
6.		**පර්යේෂණ හා සංවර්ධනය**	19
	6.1	පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන	20
	6.2	වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු	20
	6.3	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	20
7.		**මූල්‍ය හා විගණනය**	21

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 22

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 22

7.3 ව්‍යාපෘතිය පිළිබඳ විස්තර (විදේශ/දේශීය අරමුදල් සම්පාදිත) 22

7.4 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත) 22

7.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) 23

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) 23

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2015 23

7.8 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2015 23

7.9 වර්ෂ 2015 දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 24

7.10 වර්ෂ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය 25

7.11 වර්ෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 26

7.12 විගණකාධිපතිතුමාගේ වාර්තාව 27

7.13 විගණකාධිපතිතුමාගේ වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු 38

1. උපකුලපතිතුමාගේ සමාලෝචනය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය රැකියා සඳහා බඳවා ගැනීමේ නිර්ණායක හා උසස් අධ්‍යාපන ප්‍රතිදානය අතර අනනුකූලතා පරතරය යා කරනු පිණිස වූ අත්හදා බැලීමක් වශයෙන් ස්ථාපිත කරන ලදී. මෙම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ 14 වැනි ජාතික විශ්වවිද්‍යාලය වශයෙන් 2005 ජූනි 1 වැනි දින පිහිටුවන ලදී. ඒ අනුව එය නවීන අධ්‍යාපනික සංකල්ප සහිතව සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පද්ධතිය කෙරෙන් වෙනස් වූවක් වූ අතර මූලික වශයෙන් ඉලක්ක කෙරෙනුයේ විශිෂ්ට කුසලතා හා නිපුණතා සමගින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති හැකියාව වෙත ය. මෙම විශ්වවිද්‍යාලය මෙරට උසස් අධ්‍යාපනික පද්ධතිය මට්ටමට පත් කළ උසස් ප්‍රතිඵල අත්කර ගත් බව හා අපේක්ෂා අභිභවා සාර්ථකත්වය අත්කර ගනිමින් සිටින බව විචාරකයින් පවසති.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පළමුවැනි සහමුලින්ම ව්‍යවසායික විශ්වවිද්‍යාලයයි. එය බදුල්ල මනරම් කඳුකර ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුනු දර්ශන සහිත අක්කර 59 ක භූමිභාගයක් සිසාරා පැතිර ඇත.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ජාතික සම්පත් වලට අගය එකතු කිරීම කෙරෙහි බලවත් අවධාරණයක් ඇතිව පර්යේෂණය හා ඉගෙනීම මත අවධානය යොමු කරයි. අපි පරිපූර්ණ හා සමබර පුද්ගලයින් බිහි කරමු. ඔවුහු මෙරට ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික දැනුම භාවිතා කිරීමේ හැකියාව ඇත්තෝ වෙති.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි පීඨ තුනක් ඇති අතර ඒවා දේශීය හා ජාත්‍යන්තර අවශ්‍යතා සපුරන බහුවිෂය ක්ෂේත්‍රීය උපාධි වැඩ සටහන් ඉදිරිපත් කරයි.

පීඨය	උපාධි වැඩ සටහන
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව අපනයන කෘෂිකර්මය තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම ජලජ සම්පත් තාක්ෂණය තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම
විද්‍යා හා තාක්ෂණ	විද්‍යාව හා තාක්ෂණය පරිගණක විද්‍යාව හා තාක්ෂණය කර්මාන්ත තොරතුරු තාක්ෂණය ඛනිජ සම්පත් හා තාක්ෂණය
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණ ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය

වගුව: විශ්වවිද්‍යාලයේ පීඨ සහ උපාධි වැඩසටහන්

ඉහත වැඩ සටහන් වලට අමතරව, නව උපාධි වැඩ සටහන් එනම් තාක්ෂණවේද විෂයධාරාව යටතේ වූ ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳ උපාධිය හා ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ උපාධිය ඇරඹීමට කටයුතු කර ඇත.



රූප සටහන: උපාධි අපේක්ෂක ගහනය (2011 - 2016)

මෙම විශ්වවිද්‍යාලය සැලකිය යුතු අරමුණු සංඛ්‍යාවක් සාක්ෂාත් කර ගෙන ඇති අතර, රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් වාර්ෂික ශිෂ්‍යය ප්‍රතිග්‍රහණය වැඩි කිරීමට සැලසුම් කර ඇත. 2015 වර්ෂයේදී ශිෂ්‍යය ගහනය 1978 ක් වූ අතර සමස්ත අධ්‍යයන, අනධ්‍යයන, පරිපාලන හා සෙසු කාර්යය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 225 ක් විය.

පුළුල් පොදු අධ්‍යාපනය ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ට ශක්තිමත් පදනමක් ලබා දෙයි. බහුවිධ භාෂාවන් ශිෂ්‍යය ශිෂ්‍යයාවන් අතර අදහස් හුවමාරු කර ගැනීමට ඇති බාධකය ඉවත් කරයි. මනා ලෙස කළමනාකරණය කෙරෙන නේවාසිකාගාර පහසුකම් වලින් සැලකිය යුතු ශිෂ්‍යය සංඛ්‍යාවක් ප්‍රයෝජන ලැබූ අතර ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මනා පරිසරයක් පවතී. නේවාසික විශ්වවිද්‍යාලයක් සඳහා අවශ්‍ය සියලුම පහසුකම් සැපයීම මගින් ශිෂ්‍යය ශිෂ්‍යයාවන් තුළ සංස්කෘතික හා සදාචාරාත්මක ගුණවගාවට හිතකාමී පරිසරයක් වර්ධනය කිරීමට මෙම විශ්වවිද්‍යාලය යත්න දරයි. තවද උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ රැකියා නියුක්ති හැකියා අවශ්‍යතා සපුරාලනු පිණිස කර්මාන්ත වල හා කොටස් කරුවන්ගේ අදහස් ද විමසා අධ්‍යයන විෂයය මාලාවන් ප්‍රතිශෝධනය කර ඇත.

උපාධි වැඩ සටහනේ නම	වර්ෂය				
	2011	**2012**	**2013**	**2014**	**2015**
සත්ත්ව විද්‍යාව	29	36	50	35	42
අපනයන කෘෂිකර්මය	32	38	37	31	43
තේ තාක්ෂණය හා අගය එක් කිරීම	-	40	42	37	43
ජලජ සම්පත් තාක්ෂණය	-	-	47	39	39
තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	-	-	39	38	44
විද්‍යාව හා තාක්ෂණය	38	38	35	41	35
පරිගණක විද්‍යාව හා තාක්ෂණය	36	43	39	40	42
කර්මාන්ත තොරතුරු තාක්ෂණය	-	41	40	43	40
ඛනිජ සම්පත් හා තාක්ෂණය	-	49	36	34	31
ව්‍යවසායකත්වය හා කළමනාකරණ	38	52	47	47	49
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	-	-	32	51	42
එකතුව	**173**	**337**	**444**	**436**	**450**

වගුව: උපාධිධාරීන් ප්‍රදානය 2011 - 2015

පසුගිය උපාධිධාරී ශිෂ්‍යය කාණ්ඩ 5 ම මෙරට රැකියා අවස්ථා සඳහා ඉක්මණින් අන්තර්ග්‍රහණය කර ගන්නා ලදී. මෙම වාර්තා ද සමග විශ්වවිද්‍යාලය 80% හා 100% අතර පරාසයක රැකියා නියුක්ති හැකියා අනුපාතිකයක් පවත්වා ගෙන යයි. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සිය උපාධිලාභීන් සඳහා දීප්තිමත් අනාගතයක් සහතික වෙයි. ඉහළ රැකියා නියුක්තික හැකියාවක් සහිතව එය සාර්ථක බව සනාථ කර ඇත.



රූප සටහන : උපාධිධාරීන් ප්‍රදානය 2010 - 2015

විවෘත හා දුරස්ථ ඉගෙනුම් කේන්ද්‍රය (සී.ඕ.ඩී.එල්.) නවීකරණය කර ඇති අතර එය දැනටමත් ඌව පළාතේ කොටස් කරුවන් සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය හා ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා අරඹා ඇත. එයට අමතරව, කළමනාකරණ අධ්‍යයන පීඨය බාහිර උපාධි වැඩ සටහන් අරඹනු පිණිස මූලික සංවිධිවිධාන සම්පූර්ණ කර ඇත

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි මූලාරම්භයේ පටන්ම එහි කාර්යය මණ්ඩල සාමාජිකයින් විසින් සපයනු ලබන සේවාවෙහි එක් කුළුණක් ලෙස පර්යේෂණ සංරචකය පැවත එයි. මෙම විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන සතුටුදායක මට්ටමක පවතින අතර, ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යාව 346 ක් ද අත්කර ගනු ලැබූ දේශීය හා ජාත්‍යන්තර සම්මාන සංඛ්‍යාව 05 ක් ද ලෙස පැවතුණි. තරුණ පර්යේෂකයින් හට සිය සොයා ගැනීම් පර්යේෂණ ප්‍රජාව වෙත ඉදිරිපත් කොට සිය වෘත්තිය අරඹනු හැකි වන සේ ඉතා කෙටි කාල පරාසයන් තුළ පර්යේෂණ සැසි පැවැත්වේ. විශ්වවිද්‍යාලීය පර්යේෂණය සෘජුවම ජාතික සම්පත් සංවර්ධනය හා සමාජ සුභ සාධනය වෙත දායක වේ.



රූප සටහන: පර්යේෂණය හා සංවර්ධනය - 2015

විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විද්‍යාත්මක හා පර්යේෂණාත්මක රචනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම සඳහා ඇපකැප වී සිටී. අයවැය බාධක නොතකා අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙත පර්යේෂණ අරමුදල් ලබා දෙන ලදී.

කාර්ය මණ්ඩලය		2011	2012	2013	2014	2015
අධ්‍යයන කාර්යය මණ්ඩලය	මහාචාර්ය	01 (ආරාධිත පදනමින්)	-	-	-	-
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	11	10	13	21	38
	කථිකාචාර්ය/කථිකාචාර්ය (පරිවාස)	75	75	78	68	63
පරිපාලන කාර්යය මණ්ඩලය		12	15	13	16	15
උපකාරක කාර්යය මණ්ඩලය		04	04	04	04	40
එකතුව		**102**	**104**	**108**	**109**	**156**

වගුව: මානව සම්පත් සංවර්ධනය

අධ්‍යයන හා අනධ්‍යයන පුරප්පාඩු බොහොමයක් පුරවනු ලැබූ අතර, මීළඟ වර්ෂයේ මිනිස්බල අවශ්‍යතා සම්බන්ධයෙන් භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් කර තිබේ.

පෙර පැවති මෙහෙයුම් සහකාර ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර පුහුණුලාභීන්ගේ සේවය සය මසකට සීමා කරනු ලැබ ඇත. නූතන කළමනාකරණ ක්‍රමවේද සැලකිල්ලට ගෙන, මෙම විද්‍යාලය ආරක්ෂක, පවිත්‍රකරණ හා තවත් යම් මෙහෙයුම් සේවාවන් බැහැරට පවරා ඇත. විශ්වවිද්‍යාලය තුළ පුහුණු වීමේ පහසුකම් ලබා දීම මගින් ඌව පළාතේ තරුණ තරුණියන්ට සැලකිය යුතු සේවයක් සැලසීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ, නව ක්‍රීඩා සංකීර්ණය හා ක්‍රීඩා මණ්ඩපය ඉදිකරන ලදී. විශ්වවිද්‍යාලීය ක්‍රීඩා අංශය නවීකරණය කරනු ලද අතර, ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ගේ ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන නව උපකරණ මිළට ගන්නා ලදුව මේ වන විට ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ එම පහසුකම් පරිහරණය කරති. රුපියල් මිලියන 150 ක පිරිවැයකින් නිම කරන ලද නව සනාතන ගොඩනැගිල්ල පරිපාලන හා අධ්‍යයන කාර්යය මණ්ඩල විසින් පරිහරණය කෙරේ.

ගුණාත්මකතා සාධක අංශය, වෘත්තීය මාර්ගෝපදේශන අංශය වැඩි දියුණු කොට, අධ්‍යයන වැඩ සටහන් වල ගුණාත්මකතාව දියුණු කරනු පිණිස ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල සාමාජිකයින් දෙදෙනකු අර්ධ කාලීන පදනමින්

අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කරනු ලැබූ අතර, වෘත්තීය මාර්ගෝපදේශන අංශය ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ගේ අනාගත රැකියා නියුක්තිය සඳහා පුහුණු කරනු පිණිස රැකියා පොළ නිතිපතා පවත්වයි.

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.



රූප සටහන: පුනරාවර්තන වියදම්



රූප සටහන: ප්‍රාග්ධන වියදම්

වර්ෂ 2016-2020 කාල පරිච්ඡේදය සඳහා සංස්ථායික සැලැස්ම හා කාර්යය සැලැස්ම පිළියෙළ කරන ලදුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදී. තවද, සංස්ථායික සැලැස්ම හා කාර්යය සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය සොයා බලනු පිණිස නිරීක්ෂණ හා සමාලෝචන කමිටුව පත් කරන ලදී.

ආචාර්ය ජී. චන්ද්‍රසේන
උප කුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

2. පාලක සභාව සහ සනාතන සභාව

2.1 පාලක සභාව - 2015

උප කුලපති

ආචාර්ය ජී. චන්ද්‍රසේන

පීඨාධිපතිවරු

ආචාර්ය එස්.සී.ජයමාන්න	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී. අත්තනායක	විද්‍යා හා තාක්ෂණවේද පීඨය (2015.07.17 දින දක්වා)
ආචාර්ය ටී.පී.එස්.කේ. එදිරිවීර	විද්‍යා හා තාක්ෂණවේද පීඨය (2015.08.21 දින සිට)
ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු	කළමනාකරණ පීඨය

සනාතන සභාව විසින් පහත සාමාජිකයින් දෙදෙන සභාව තුළ නියෝජනය කිරීමට පත් කරන ලදී.

ආචාර්ය කේ.බී. විජේසේකර

ආචාර්ය එල්.එම්.එච්.ආර්. අල්විස්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්

පූජ්‍ය මුරුද්දෙණියේ ධම්මරතන හිමි	(2015.03.14 දින දක්වා)
ආර්. දිසානායක මහතා	(2015.04.20 දින දක්වා)
එස්.එම්. ජයතිලක මහතා	(2015.03.13 දින දක්වා)
වෛද්‍ය එම්.කේ.ඩී. සේනානායක	(2015.04.20 දින දක්වා)
පී.ජී. රත්නායක මහතා	(2015.03.13 දින දක්වා)
එල්.ජී.එල්.ජී. ගුණතිලක මහතා	(2015.04.20 දින දක්වා)
එම්.එම්.වී. පීරිස් මහතා	(2015.04.20 දින දක්වා)
වෛද්‍ය කේ.බී. ගල්කැටිය	(2015.09.23 දින දක්වා)
වෛද්‍ය ඩබ්ලිව්. අබේකෝන්	(2015.04.20 දින සිට)
ටී. නන්දසේන මහතා	(2015.04.20 දින සිට)
වෛද්‍ය ඒ. ගුණවර්ධන	(2015.04.20 දින සිට)
එන්. අබේසිරි මහතා	(2015.04.20 දින සිට 2015.10.16 දින දක්වා)
එච්. දයාවංශ මහතා	(2015.04.20 දින සිට)

2.2 සනාතන සභාව - 2015

උප කුලපති

ආචාර්ය ජී. චන්ද්‍රසේන

පීඨාධිපතිවරු

ආචාර්ය එස්.සී. ජයමාන්න	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී. අත්තනායක	විද්‍යා හා තාක්ෂණවේද පීඨය (2015.07.17 දින දක්වා)
ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර	විද්‍යා හා තාක්ෂණවේද පීඨය (2015.08.21 දින සිට)
ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු	කළමනාකරණ පීඨය

අධ්‍යයනාංශ ප්‍රධානීහු

ආචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන	සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය එල්.එම්.එච්.ආර්. අල්විස්	අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය
ආචාර්ය කේ.බී. විජේසේකර	විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය
ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර	පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය (වැඩ බලන)
පී.එච්. අබේවීර මහතා	කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය එච්.ආර්.එන්. පීරිස්	රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය

පීඨ නියෝජිතවරු

පී.බී.ඒ.අයි.කේ. බුළුමුල්ල මිය	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
ආචාර්ය ආර්.ආර්.එම්.කේ.කේ. විජේසුන්දර	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය (2015.10.01 දින සිට 2015.12.31 දින දක්වා)
ආර්.එම්.සී.ඩබ්ලිව්.එම්. රත්නායක මිය	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
ආචාර්ය පී.එම්. සිරිමාන්න	විද්‍යා හා තාක්ෂණවේද පීඨය
ආචාර්ය ඒ.ආර්. කුමාරසිංහ	විද්‍යා හා තාක්ෂණවේද පීඨය
ආචාර්ය පී.එච්.ටී. කුමාර	කළමනාකරණ පීඨය
එම්. රූබවනාදන් මහතා	කළමනාකරණ පීඨය
ඩී.පී.සී. විතාන මිය	සහකාර පුස්තකාලයාධිපතිනි

03. සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



4.

ශිෂ්‍යය කටයුතු

- ශිෂ්‍යය ශිෂ්‍යයාවන් බඳවා ගැනීම
- නව ඇතුළත්වීම්
- විදේශ ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ
- උපාධි ප්‍රදානය
- නේවාසිකාගාර පහසුකම් - විශ්වවිද්‍යාලයට අයත් හා කුලියට ලබා ගත්
- ශිෂ්‍යත්ත්ව - මහපොළ, ශිෂ්‍යාධාර හා වෙනත් ශිෂ්‍යත්ත්ව

4.1 ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ සහ මානව සම්පත්

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍යය සංඛ්‍යාව	අධ්‍යයන කාර්යය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව	අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	186	68	පීඨ තුනම හා පොදු පරිපාලනය විසින් පොදුවේ සේවය ලබා ගනු ලැබූ අනධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් 40 දෙනෙක් හා පරිපාලන කාර්යය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙක් සිටියහ.
	අපනයන කෘෂිකර්මය	169		
	තේ තාක්ෂණය හා අගය එක් කිරීම	136		
	ජලජ සම්පත් තාක්ෂණය	154		
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	144		
විද්‍යා හා තාක්ෂණ	විද්‍යාව හා තාක්ෂණය	185	72	
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය	215		
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය	194		
	ඛනිජ සම්පත් හා තාක්ෂණය	169		
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණ	214	27	
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	212		
එකතුව		**1978**	**167**	

4.2 ශිෂ්‍යය ශිෂ්‍යයාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමට යෝජිත ශිෂ්‍යය සංඛ්‍යාව 2015 වර්ෂයේ දී වැඩි කරන ලදී. ඒ අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ හා විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ එක් එක් උපාධි වැඩ සටහනක් සඳහා ශිෂ්‍යය ශිෂ්‍යයාවන් 60 දෙනකු බැගින් සහ කළමනාකරණ පීඨය සඳහා ශිෂ්‍යය ශිෂ්‍යයාවන් 65 දෙනකු බඳවා ගනී. ඔවුන් තෝරා ගනු ලැබුවේ අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල හා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කර ගෙන ය.

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර (2013/2014 ශිෂ්‍යය කාණ්ඩය)	දෙවන වසර (2012/2013 ශිෂ්‍යය කාණ්ඩය)	තෙවන වසර (2011/2012 ශිෂ්‍යය කාණ්ඩය)	සිව්වන වසර (2010/2011 ශිෂ්‍යය කාණ්ඩය)
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	ඉංග්‍රීසි	48	47	47	44
	අපනයන කෘෂිකර්මය		50	39	43	37
	තේ තාක්ෂණය හා අගය එක් කිරීම		36	36	23	41
	ජලජ සම්පත් තාක්ෂණය		38	42	34	40
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම		42	33	24	45
විද්‍යා හා තාක්ෂණ	විද්‍යාව හා තාක්ෂණය		43	50	49	43
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය		51	49	67	48

	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		62	49	38	45
	ඛනිජ සම්පත් හා තාක්ෂණය		52	43	32	42
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණ		60	53	52	49
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		62	48	55	47
එකතුව			**544**	**489**	**464**	**481**

4.2.1 ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා නව ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ

පීඨය	අධ්‍යයන පාඨමාලාව	ඇතුළත් කර ගැනීමේ වර්ෂය	ඇතුළත් කර ගැනීමට එකඟ වූ සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍යය සංඛ්‍යාව
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	2013/14	60	48
	අපනයන කෘෂිකර්මය		60	50
	තේ තාක්ෂණය හා අගය එක් කිරීම		60	36
	ජලජ සම්පත් තාක්ෂණය		60	38
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම		60	42
විද්‍යා හා තාක්ෂණ	විද්‍යාව හා තාක්ෂණය		60	43
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය		60	51
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		60	62
	ඛනිජ සම්පත් හා තාක්ෂණය		60	52
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණ		65	60
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		65	62

4.2.2 ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා නව ඇතුළත්වීම් - විදේශීය ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ

පීඨය	අධ්‍යයන පාඨමාලාව	ඇතුළත් කර ගැනීමේ වර්ෂය	රට	ලියාපදිංචි ශිෂ්‍යය සංඛ්‍යාව
විද්‍යා හා තාක්ෂණ	පරිගණක විද්‍යාව හා තාක්ෂණය	2013/14	පාකිස්ථානය	02
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය			01

අභිනවයෙන් ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍යය කාණ්ඩයේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය (2013/2014 ශිෂ්‍යය කාණ්ඩය)



4.3 උපාධි ප්‍රදානය - 2015

අධ්‍යයන පාඨමාලාව	2015 වර්ෂය		
	පිරිමි	කාන්තා	එකතුව
සත්ත්ව විද්‍යාව	22	20	42
අපනයන කෘෂිකර්මය	11	32	43
තේ තාක්ෂණය හා අගය එක් කිරීම	22	21	43
ජලජ සම්පත් තාක්ෂණය	15	24	39
තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	19	25	44
විද්‍යාව හා තාක්ෂණය	15	20	35
පරිගණක විද්‍යාව හා තාක්ෂණය	22	20	42
කර්මාන්ත තොරතුරු තාක්ෂණය	12	28	40
ඛනිජ සම්පත් හා තාක්ෂණය	12	19	31
ව්‍යවසායකත්වය හා කළමනාකරණය	17	32	49
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	15	27	42
එකතුව	**182**	**268**	**450**

වර්ෂයේ උපාධි ලැබූ ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ගේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය (2010/2011 ශිෂ්‍යය කාණ්ඩය)



4.4 නේවාසිකාගාර

4.4.1 විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර

නම	පිහිටි ස්ථානය	ධාරිතාව			වර්ෂයකට ශිෂ්‍යය ගාස්තුව
		පිරිමි	කාන්තා	එකතුව	
කොරල් බියුටි	විශ්වවිද්‍යාල පරිශ්‍රය	129	-	194	5000.00
සිල්ව(ර්) ටිප්ස්		65	-		
බිලුසෆය(ර්)		-	138	276	
කැට්ලියා		-	138		

4.4.2 කුලියට ගනු ලැබූ නේවාසිකාගාර

පිහිටි ස්ථානය	වර්ෂයකට කුලිය (රුපියල්)	2015 දෙසැම්බර් 31 දිනට නේවාසිකව සිටි සංඛ්‍යාව		
		පිරිමි	කාන්තා	එකතුව
මහවැලි	270,000	16	-	48
නකල්ස්	252,000	14	-	
රඹුක්පොත	352,800	18	-	
ගිම්හාන	240,000	-	09	120
හන්තාන	300,000	-	15	
හංවැල්ල	277,200	-	13	
කැලණි - ඒ	192,780	-	10	
කැලණි - බී	192,780	-	11	
වලවේ	207,900	-	10	
සමනල - 1	611,100	-	27	
සමනල - 2	259,344	-	09	
සමනල - 3	264,000	-	09	
කළුගල්පිටිය	120,000 (මාස 6 ට)	-	7	
එකතුව	**3,539,904**	**48**	**120**	**168**

4.5 ශිෂ්‍යත්ත්ව

4.5.1 2015 වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්ත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර

පීඨය	ඇතුළත් කර ගනු ලැබූ වර්ෂය	ශිෂ්‍යය කාණ්ඩ වර්ෂය	ශිෂ්‍යත්ත්වලාභීන් සංඛ්‍යාව	
			මහපොළ	ශිෂ්‍යාධාර
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	2013/2014	1 වන වසර	26	78
	2012/2013	2 වන වසර	63	34
	2011/2012	3 වන වසර	71	10
	2010/2011	4 වන වසර	43	70
විද්‍යා හා තාක්ෂණ	2013/2014	1 වන වසර	53	35
	2012/2013	2 වන වසර	81	11
	2011/2012	3 වන වසර	74	17
	2010/2011	4 වන වසර	62	41
කළමනාකරණ	2013/2014	1 වන වසර	17	63
	2012/2013	2 වන වසර	51	12
	2011/2012	3 වන වසර	18	32
	2010/2011	4 වන වසර	17	65
එකතුව			**576**	**468**

4.5.2 2015 වර්ෂයේ වෙනත් ශිෂ්‍යත්ත්ව පිළිබඳ විස්තර

පීඨය	ශිෂ්‍යත්ත්වයේ නම	ශිෂ්‍යත්ත්ව ලාභීන් සංඛ්‍යාව
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	කුලපති ශිෂ්‍යත්වය	126
විද්‍යා හා තාක්ෂණ		107
කළමනාකරණ		56
එකතුව		**289**

5.

මානව සම්පත්

- අධ්‍යයන කාර්යය මණ්ඩලය
- පරිපාලන කාර්යය මණ්ඩලය
- අධ්‍යයන උපකාරක සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය

5.1 අධ්‍යයන කාර්යය මණ්ඩලය

පීඨය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු	මහාචාර්යවරු	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු - I හා II ශ්‍රේණි	කථිකාචාර්යවරු	කථිකාචාර්යවරු (පරිවාස)	තාවකාලික කථිකාචාර්යවරු/ ප්‍රදර්ශකවරු
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	ඉංග්‍රීසි	-	-	15	01	30	22
විද්‍යා හා තාක්ෂණ		-	-	14	-	16	42
කළමනාකරණ	සිංහල/ දමිළ/ ඉංග්‍රීසි	-	-	09	05	08	05
පුස්තකාලය		-	-	-	-	3 (සහකාර පුස්තකාලයාධිපතිවරු)	-
එකතුව		-	-	38	06	57	69

5.2 පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය

2015 වර්ෂයේ දී එක් එක් සේවක ගණය තුළ සේවය කළ පරිපාලන කාර්යය මණ්ඩල සාමාජික සංඛ්‍යාව පහත පරිදි වේ:

සේවක ගණය	අනුමත සේවක පිරිස	තථ්‍ය සේවක පිරිස	සටහන්
ලේඛකාධිකාරී	1	1	කොන්ත්‍රාත් පදනමින්
මූල්‍යාධිකාරී	1	1	- -
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	7	5	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් වෙනුවට සහකාර ලේඛකාධිකාරීවරුන් 03 දෙනෙක් ද ඇතුළුව
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	4	4	- -
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	1	1	- -
කාර්යය ඉංජිනේරු	1	1	ආරාධිත ඉංජිනේරුවරයාගෙන් සේවය ලබා ගනු ලැබිය. ස්ථිර කාර්යය ඉංජිනේරුවරයකු තෝරා ගෙන ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමට නියමිතව ඇත.
ප්‍රධාන ආරක්ෂක නිළධාරී (කොන්ත්‍රාත් පදනම)	1	1	ස්ථිර ප්‍රධාන ආරක්ෂක නිළධාරීවරයකු තෝරා ගෙන ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමට නියමිතව ඇත.
ප්‍රධාන විනයාරක්ෂක නිළධාරී	1	0	- -
අධ්‍යක්ෂ - ශාරීරික අධ්‍යාපන	1	0	ස්ථිර ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂවරයකු තෝරා ගෙන ඇති අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමට නියමිතව

			ඇත.
උප කුලපතිතුමාගේ පුද්ගලික ලේකම්	1	0	පුරප්පාඩු වී ඇත.
විශ්වවිද්‍යාලීය වෛද්‍ය නිළධාරී	2	1	පුරප්පාඩු 01 යි.
පූර්ණ කාලීන නේවාසිකාගාර පාලක	1	0	අධ්‍යයන පාලක විසින් ආවරණය කෙරේ.
එකතුව	22	15	

5.3 අධ්‍යයන උපකාරක හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව

මුළු අධ්‍යයන හා උපකාරක කාර්යය මණ්ඩල වල එක් එක් සේවක ගණයේ අනුමත සංඛ්‍යා මෙන්ම තථ්‍ය සංඛ්‍යා පහත දැක්වේ;

සේවක ගණය	අනුමත සේවක පිරිස	තථ්‍ය සේවක පිරිස	සටහන්
ක්‍රමලේඛක හා පද්ධති විශ්ලේෂක	2	1	කොන්ත්‍රාත් පදනමින්
ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක	2	1	--
උපදේශක (පරිගණක තාක්ෂණවේදය)	4	0	--
උප පාලක (පූර්ණ-කාලීන)	4	1	--
විනයාරක්ෂක නිළධාරී	1	0	--
සුපරීක්ෂක (සිවිල්)	1	1	කොන්ත්‍රාත් පදනමින්
විගණන සහකාර	1	1	--
පොත් තබන්නා	1	0	--
ඖෂධවේදී	1	1	--
හෙද නිළධාරී/ හෙදිය	2	0	--
තාක්ෂණික නිළධාරී	12	2	--
පරිගණක යෙදුම් සහකාර (CAA)	27	22	--
ලඝුලේඛක (ඉංග්‍රීසි)	5	5	--
දුරකථන ක්‍රියාකරු හා පිළිගැනීමේ නිළධාරී	2	0	--
පුස්තකාල සහකාර	3	1	--
සරප්	2	0	පරිගණක යෙදුම් සහකාර විසින් ආවරණය කෙරේ.
ලිපිකරු	6	1	--
ගබඩා භාරකරු	2	1	--
ආරක්ෂක නියාමක	1	0	--
ගොවිපළ සුපරීක්ෂක	1	0	--
ආගන්තුක නිවාස භාරකරු	3	0	--
කම්කරු	4	2	--
විදුලි කාර්මික ශිල්පී	1	0	--
ජලනල ශිල්පී	1	0	--
වඩු කාර්මික ශිල්පී	1	0	--

වැද්දුම් ශිල්පී	1	0	--
සාත්තු සේවක (සෞඛ්‍ය සේවා)	1	0	--
පර්යේෂණාගාර පරිචාර සේවක	10	0	--
රියැදුරු	2	0	--
එකතුව	104	40	

5.4 අනධ්‍යයන කාර්යය මණ්ඩලය බෙදී ගොස් ඇති ආකාරය

පීඨය/ ශාඛාව	ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය	කනිෂ්ඨ කාර්යය මණ්ඩලය	සුළු සේවකයෝ
උප කුලපතිතුමාගේ කාර්යාලය	--	03	--
ලේඛකාධිකාරීතුමාගේ කාර්යාලය	--	02	--
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	--	02	--
විද්‍යා හා තාක්ෂණ පීඨය	01	02	02
කළමනාකරණ පීඨය	--	01	--
ශිෂ්‍යය කටයුතු අංශය	03	02	--
මානව සම්පත් අංශය	--	02	--
පොදු පරිපාලන අංශය	--	02	--
විභාග අංශය	--	04	--
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	--	02	--
මුදල් අංශය	01	08	--
පුස්තකාලය	--	01	--
වෛද්‍ය මධ්‍යස්ථානය	--	01	--
ව්‍යාපෘති	--	01	--
එකතුව	**05**	**33**	**02**

* සුළු සේවකයින්ගේ සේවාවන් සේවා සම්පාදකයින් වෙතින් ලබා ගනු ලැබිය.

6.

පර්යේෂණ හා සංවර්ධනය

- පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන
- සම්මාන පිළිබඳ විස්තර
- වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

6.1 පර්යේෂණ, නවෘකරණ හා ප්‍රකාශන

2015 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නවෘකරණ හා ප්‍රකාශන;

විෂයය	ප්‍රකාශිත	ඉදිරිපත් කරන ලද
සඟරා ලිපි සංඛ්‍යාව	100	-
ග්‍රන්ථ/ පරිච්ඡේද සංඛ්‍යාව	9	-
සමුළු සාකච්ඡාවන්හි දී පූර්ණ නිබන්ධ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද සමුළු නිබන්ධ සංඛ්‍යාව	24	-
උද්‍ධෘත සංඛ්‍යාව	181	181
පෝස්ටර් සංඛ්‍යාව	11	11
නවෘකරණ/ නිපැයුම් සංවර්ධන සංඛ්‍යාව	2	-
වැඩි දියුණු කරන ලද නිපැයුම් සංඛ්‍යාව	18	-
සංවර්ධනය කරන ලද නිර්මාණ මූලාකෘති	1	1
එකතුව	**346**	**193**

6.2 වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

විෂයය	සහභාගි වූ/ පිරිනමනු ලැබූ	සම්පූර්ණ කරන ලද
උපාධි වැඩ සටහන් සංඛ්‍යාව	11	-
සහතිකපත්‍ර වැඩ සටහන් සංඛ්‍යාව	05	-
ප්‍රජා සේවා සම්පාදන වැඩ සටහන් සංඛ්‍යාව	-	18
කාර්යය මණ්ඩල සංවර්ධන සම්මන්ත්‍රණ හා වැඩමුළු සංඛ්‍යාව	-	9
එකතුව	**16**	**27**

6.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

විෂයය	සම්මාන සංඛ්‍යාව	විද්වතුන් සංඛ්‍යාව
දේශීය සම්මාන	5	5
ජාත්‍යන්තර සම්මාන	-	-
එකතුව	**5**	**5**

2015 වර්ෂයේ දී ලද සම්මාන විස්තරාත්මකව

සම්මානය	සම්මානලාභීන් ගේ නම්	පීඨය
විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා වූ ජනාධිපති සම්මාන	ආචාර්ය ඩී.කේ.ඩී.ඩී ජයසේන	සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) 27 වැනි වාර්ෂික සැසිවාරයේ දී ''සත්ව විද්‍යා සැසිය'' තුළ ''විශිෂ්ඨතම ඉදිරිපත් කරන්නා'' සම්මානය	එන්.එම්.එන් නම්බපාන මිය	
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) 27 වැනි වාර්ෂික සැසිවාරයේ දී ''සත්ව විද්‍යා සැසිය'' තුළ ''සමස්ත විශිෂ්ඨතම ඉදිරිපත් කරන්නා'' සම්මානය	එන්.එම්.එන් නම්බපාන මිය	
විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා වූ එන්.ආර්.සී. කුසලතා සම්මානය	ආචාර්ය කේ.බී. විජේසේකර	විද්‍යා හා තාක්ෂණ
විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා වූ එන්.ආර්.සී. කුසලතා සම්මානය	ආචාර්ය ඊ.පී.එස්.කේ එදිරිවීර	

7.

මූල්‍ය හා විගණනය

- පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් පිළිබඳ විස්තර
- ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)
- මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)
- මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)
- මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය 2015
- 2015 වර්ෂයේ දී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර
- 2015 දෙසැම්බර් වන විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය
- 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
- විගණකාධිපති වාර්තාව
- විගණකාධිපති වාර්තාවට පිළිතුරු

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

විෂයය	2015	2014
අ. පුද්ගල පඩිනඩි	213,723,414	159,510,038
ආ. ගමන්	1,004,694	1,484,599
ඇ. සැපයුම්	10,315,367	9,223,701
ඈ. නඩත්තුව	3,659,271	2,962,331
ඉ. ගිවිසුම්ගත සේවා	108,599,062	119,325,799
ඊ. වෙනත්	27,172,161	18,602,962
එකතුව	**364,473,969**	**311,109,430**

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

විෂයය	2015	2014
අ. ඉඩම් අත්කර ගැනීම	50,000	8,525,000
ආ. ගෘහ භාණ්ඩ හා වෙනත් උපකරණ අත්කර ගැනීම	16,872,165	9,503,706
ඇ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	23,078,162	20,281,326
ඈ. ගොඩනැගිලි හා ව්‍යුහ අත්කර ගැනීම	129,212,005	116,769,530
ඉ. වෙනත්	6,507,281	3,157,270
එකතුව	**175,719,613**	**158,236,832**

7.3 ව්‍යාපෘතිය පිළිබඳ විස්තර (විදේශ/දේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

නම හා විස්තර	ණය/ ප්‍රදානය	අරමුදල් සම්පාදන ආයතනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	ලියාපදිංචි අරමුදල් ආයතන	ආධාරදායක අරමුදල්
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘතිය අදියර 1 හා 2	-	-	3,420	-	✓
එකතුව	-	-	3,420	-	-

7.4 ව්‍යාපෘති වියදම පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

නම	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2015 වියදම	2014 වියදම	2015.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘතිය අදියර 1 හා 2	3,420	122.87	70.80	2,023.37	70%
එකතුව	**3,420**	**122.87**	**70.80**	**2,023.37**	**70%**

7.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

රුපියල්

විෂයය	2015 ප්‍රතිපාදනය	2015 තුළ වියදම	ඉතිරිය/ (අතිරික්තය)
අ. ව්‍යාපෘතිය නොවන පුනරාවර්තන	450,000,000	358,901,383	91,098,617
ආ. ව්‍යාපෘතිය නොවන මූලධන	115,000,000	52,849,494	62,150,506
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්	145,000,000	122,870,119	22,129,881
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්	-	-	-
එකතුව	**710,000,000**	**534,620,996**	**175,379,004**

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

රුපියල්

ආදායම් මූලාශ්‍රය	2015 තුළ ප්‍රතිපාදන	2015 තුළ එකතු වූ මුදල	ඌණතාව / අතිරික්තය
අ. ප්‍රථම උපාධි අධ්‍යයනය (නේවාසිකාගාර හා ලියාපදිංචි ගාස්තු ආදිය)	7,550,000	6,945,607	(604,393)
ආ. පශ්චාත් උපාධි අධ්‍යයනය	-	-	-
ඇ. උපදේශකත්වය (පුහුණුව, විභාග ආදිය)	6,450,000	1,134,312	(5,315,688)
ඈ. වෙනත්	-	-	-
එකතුව	**14,000,000**	**8,079,919**	**(5,920,081)**

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2015

රුපියල්

විෂයය	සූත්‍රය	එක් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යයාවක සඳහා වියදම
අ. එක් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යයාවක සඳහා පුනරාවර්තන වියදම	මුළු පුනරාවර්තන වියදම / ශිෂ්‍යය සංඛ්‍යාව	272,748
ආ. එක් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යයාවක සඳහා මූලධන වියදම	මුළු මූලධන වියදම් / ශිෂ්‍යය සංඛ්‍යාව	89,810
එකතුව		**362,559**

7.8 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2015

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම (රුපියල්)	භෞතික ප්‍රගතිය
අ. සනාතන ගොඩනැගිල්ල	44,549,734.58	90%
ආ. ගබඩා ගොඩනැගිල්ල	3,715,337.45	100%
ඇ. ක්‍රීඩා මධ්‍යස්ථානය	33,535,930.67	50%
ඈ. ගබඩා ජලාපවාහන පද්ධතිය	14,858,111.00	100%
ඉ. ක්‍රීඩා මණ්ඩපය	6,579,032.30	60%
එකතුව	**103,238,146.00**	

7.9 වර්ෂ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2015 රුපියල්	2014 රුපියල්
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දේ	01	36,258,132	8,526,006
ආයෝජන	02	18,152,475	12,554,808
අය විය යුතු ශේෂයන්	03	14,645,875	10,464,501
තොග	04	7,368,400	3,162,310
අත්තිකාරම්	05	268,131	113,744
		76,693,012	34,821,369
ජංගම නොවන වත්කම්			
අය විය යුතු ශේෂයන්	06	5,892,384	6,417,887
දේපළ, පිරියත හා උපකරණ	07	1,421,626,674	1,508,243,648
කෙරීගෙන යන වැඩ - ප්‍රාග්ධන	08	290,865,005	167,994,886
ඉඩම් හා ඉඩම් සංවර්ධන	09	58,416,399	58,366,399
ගුණාත්මකතා වර්ධන ව්‍යාපෘති	10	4,610,855	2,476,396
		1,781,411,317	1,743,499,217
මුළු වත්කම්		1,858,104,329	1,778,320,586
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	11	22,244,523	16,613,210
විවිධ ණය හිමියෝ හා වෙනත්	12	85,484,192	87,920,015
		107,728,715	104,533,225
ජංගම නොවන බැරකම්			
විලම්බිත ආදායම	13	196,300,647	159,021,600
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	14	9,396,706	7,722,914
		205,697,353	166,744,514
මුළු බැරකම්		313,426,067	271,277,739
ශුද්ධ වත්කම්		1,544,678,262	1,507,042,847
ස්කන්ධය සහ සංචිත			
සමුච්චිත අරමුදල	15	2,063,580,969	1,940,711,050
පොදු සංචිතය	16	(548,520,929)	(452,282,559)
විශේෂ සංචිතය	17	1,990,995	1,897,846
විශේෂ අරමුදල්	18	27,627,227	16,716,509
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය		1,544,678,262	1,507,042,847

7.10 වර්ෂ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2015 රුපියල්	2014 රුපියල්
ආදායම්			
පුනරාවර්තන ප්‍රදාන	19	343,371,000	326,702,000
ශිෂ්‍යාධාර හා මහපොළ ප්‍රදාන	20	30,256,550	15,368,900
ස්වයං මූල්‍යනය වැඩ සටහන්	21	1,134,312	343,400
වෙනත් ආදායම්	22	12,503,307	11,809,374
ක්‍රමක්ෂිත මූලධන ප්‍රදාන	23	49,166,033	43,767,073
මුළු ආදායම		436,431,202	397,990,747
වියදම්			
පුද්ගල පඩි නඩි	24	213,723,414	159,510,038
ගමන් වියදම් සහ යැපුම් දීමනා	25	1,004,694	1,484,599
සැපයුම්	26	10,315,367	9,223,701
නඩත්තුව	27	3,659,271	2,962,331
ගිවිසුම් ගත වියදම්	28	108,599,062	119,325,799
වෙනත් පුනරාවර්තන වියදම්	29	27,172,161	18,602,962
ස්වයං මූල්‍යනය වැඩ සටහන්	30	600,410	-
ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම්	31	30,256,550	15,368,900
ක්ෂය	32	138,765,610	131,324,532
මුළු වියදම්		534,096,538	457,802,863
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌණතාව)		(97,665,336)	(59,812,116)

7.11 වර්ෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015 රුපියල්	2014 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් මඟින් හිඟය/අතිරික්තය	(97,665,336)	(59,812,116)
මුදල් නොවන සංචලන		
ක්‍රමක්ෂිත මූලධන ප්‍රදාන	(49,166,033)	(43,767,073)
ක්ෂය	138,765,610	131,324,532
ප්‍රතිපාදන හා වෙනත්	1,673,792	2,923,544
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	(6,391,968)	30,668,887
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ආයෝජනවල (වැඩිවීම)/ අඩුවීම	(5,597,667)	(9,921,070)
අයවිය යුතු දේ (ජංගම වත්කම්) - (වැඩිවීම)/ අඩුවීම	(4,181,373)	1,436,459
අයවිය යුතු දේ (ජංගම නොවන වත්කම්) - (වැඩිවීම)/ අඩුවීම	525,504	(815,407)
තොගවල (වැඩිවීම)/ අඩුවීම	(4,206,090)	2,269,143
අත්තිකාරම් (වැඩිවීම)/ අඩුවීම	(154,387)	84,518
උපචිත වියදම් වැඩිවීම/ (අඩුවීම)	5,631,313	(22,352,323)
විවිධ ණයගැතියෝ වැඩිවීම/ (අඩුවීම)	(2,435,824)	(23,301,835)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(16,810,492)	(21,931,628)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම	(175,683,099)	(158,236,832)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(175,683,099)	(158,236,832)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
සමුච්චිත අරමුදල	122,869,919	109,668,633
විලම්බිත ආදායම	86,445,081	69,331,367
වෙනත් අරමුදල්	10,910,718	8,359,260
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	220,225,718	187,359,260
මුදල් හා මුදල් සමාන දේ හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	27,732,126	7,190,799
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	8,526,006	1,335,207
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	36,258,132	8,526,006

සැලකිය යුතුයි - 2015.12.31 දිනට බැංකු ශේෂය

බැංකුව		ගිණුම් අංකය	
ලංකා බැංකුව	-	3114828	30,695,456
ලංකා බැංකුව	-	3114820	2,421,375
ලංකා බැංකුව	-	78166821	202,235
ලංකා බැංකුව	-	78057047	761,980
මහජන බැංකුව	-	10100168384805	2,177,086
එකතුව			**36,258,132**

7.12 විගණකාධිපතිතුමාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No.	යූඩබ්/බී/ඩී/යූඩබ්ලිව්යු/ 1/15/09	ඔබේ අංකය உமது இல. Your No.	
දිනය திகதி Date	2017 ජනවාරි 25 දින.		

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වෙත 2016 ජුලි 18 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.114,130,385 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ මිලදී ගැනීම් සඳහා දරනු ලබන වියදම අදාල වර්ෂයේ වියදමක් ලෙස ලියා හැරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.12.231.211 ක්වූ ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වෙනුවෙන් ගෙවූ රු.539.200 ක නිති වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව සත්‍යාපනය කරන ලද තොග ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ තොග ශේෂය අතර රු.677.355 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ලබාගත් ශේෂ සනාථ කිරීම් හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර රු.719.287 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ කටයුතු සඳහා විවිධ පුද්ගලයන්ගෙන් ලැබුණු මූල්‍ය ප්‍රදානවල වටිනාකම රු.1.436.341 ක් බව විශ්වවිද්‍යාලය විසින් තහවුරු කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල රු.1.131.952 ක් ලෙස දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.3.531.671 ක් වටිනා පහත සඳහන් ගිණුම් විෂයයන් 03ක් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ගිණුම් විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
ආපසු ගෙවියයුතු තැන්පත්	2.009.692	කේවල ශේෂ ලැයිස්තු
ආරක්ෂක තැන්පත්	879.553	කේවල ශේෂ ලැයිස්තු
පොදු තැන්පත් - පුනරාවර්තන	642.426	තැන්පත් ලේඛන හා ශේෂ ලැයිස්තු
එකතුව	3.531.671	

AGDSL

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජුලි 28 දින විශ්වවිද්‍යාලයට උපකුලපති ලෙස පැමිණි මහාචාර්යවරයාට 2011 ජනවාරි සිට ජුලි දක්වා වූ කාලයට අදාලව ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවා තිබුණු රු.93,546 ක පර්යේෂණ දීමනා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් විස්තරයේ ඇතුළත් 2013 හා 2014 වර්ෂවලට අදාල රු.38,000 ක බැංකු වැරදි හර කිරීම නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩකිරීම සම්බන්ධයෙන් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් රු.8,440,058 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටුකළ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ගෙවිය යුතු රු.60,768,008 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය	නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා පත් කළයුතු නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව 2014 නොවැම්බර් 12 දින සිට උපකුලපතිවරයා විසින් කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු ලේඛකාධිකාරී වශයෙන් පත්කර 2015 දෙසැම්බර් 31 දිනට රු.1,645,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

AGDSL

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 139	සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කරන ලද වවුචර්වලට පමණක් ගෙවීම් කළ යුතු වුවද, ඊට පටහැනිව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට සමාලෝචිත වර්ෂයේදී රු.2,814,378 ක මුදලක් ගෙවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 156	සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළදී සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් නිසි වේලාවට නොගෙවීම නිසා රු.70,347 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණු අතර එම මුදල ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 371 (2)	නිලධාරීන් 04 දෙනෙකු විසින් ලබාගත් රු.234,912 ක අත්තිකාරම් එම කාර්යය නිමකළ විහාම පියවීමට කටයුතු නොකර ඒ සඳහා මාස 01 සිට මාස 10 දක්වාවූ කාලයක් ලබාගෙන තිබුණි.
(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ	පිරිවැය රු.2,139,950,371 ක දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් විධිමත් පරිදි වත්කම් පන්ති අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර පිරිවැය රු.32,850,376 ක පරිගණක මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ) 2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 ඡේදය	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.

(ඊ)	2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හිමි නිවාසවල හා තනිකඩ බද්ධ නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් නිවාස කුලී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.97.665.336 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.59.812.116 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37.853.220 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනය රු.16.669.000 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු.54.213.376 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී දායකත්වය වැඩි වී තිබුණු අතර 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී දායකත්වය අඩු වී තිබුණි. කෙසේ වුවද 2013 වර්ෂයේදී රු.113.423.662 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.254.823.688 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දි රජයේ ප්‍රදාන හා විලම්බිත ආදායම් හැර ආදායම් සියයට 12 කින්ද ක්ෂයවීම් හැර වියදම් හා ඌනතාවය සියයට 17 කින්ද රජයේ ප්‍රදාන සියයට 5 කින්ද වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සියයට 120 කින් වර්ධනය වී තිබූ අතර කාරක ප්‍රාග්ධනය සියයට 55 කින් අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ජංගම වගකීම්වලට ජංගම වත්කම් 3:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම්වල සිදුවූ ඉහලයාම හේතු කොට ගෙන, ජංගම වගකීම්වලට ජංගම වත්කම් 1.4:1 ක් වී ජංගම අනුපාතයේ 1.6 ක වර්ධනයක් පෙන්නුම් කළද එය ප්‍රශස්ථ මට්ටම වූ ජංගම වගකීම්වලට ජංගම වත්කම් 1:2 මට්ටමට ළඟාවී නොතිබුණි .

(ඈ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය සියයට 23 කින් අඩුවී තිබූ අතර ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහ පිළිවෙලින් සියයට 11 හා සියයට 18 කින් වර්ධනය වී තිබුණි. වර්ෂය අවසානයේ මුදල් හා සමාන දෑ වල සියයට 325 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධනය

විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ළඟාකර ගැනීමට අපේක්ෂිත උපායමාර්ගික ඉලක්ක 14 ක් සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වූ උපායමාර්ගික ඉලක්ක 2015 වර්ෂය අවසාන වන විට අපේක්ෂිත තත්ත්වයට ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෝකයේ ඉල්ලුමට සරිලන පරිදි සුදුසුකම් හා සමාජ අගයන් වැඩි දියුණු කිරීම හා වෙනස් වන කාර්මික අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස සියළු උපාධි පාඨමාලාවල විෂයමාලාවන් සංශෝධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම තුලින් උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 80 මට්ටමට ලඟාකර ගැනීම අපේක්ෂා කර තිබුණු නමුත් 2015 වර්ෂයේ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 73 ක් දක්වා පහළ බැස තිබුණි.

(ආ) විද්‍යාව, තාක්ෂණය, කෘෂිකර්මය හා කළමනාකරණ උසස් අධ්‍යාපනය සඳහා විදේශ සිසුන්ගේ සහභාගිත්වය යන අරමුණ ඉටුකර ගැනීම තුලින් විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1 ක් වුවත් 2015 වර්ෂයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 0.54 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලෝක ඉල්ලුමට සරිලන පරිදි උපාධි පාඨමාලාවල ශික්ෂණය වර්ධනය කිරීම, පර්යේෂණ හා ඉගැන්වීම්වල තත්ත්වයන් වැඩි දියුණු කිරීම හා ඉගැන්වීමට, ඉගෙන ගැනීමට හා පර්යේෂණ සඳහා වඩා උසස් යටිතල පහසුකම් ඇති කිරීම යන අරමුණු ඉටුකර ගැනීම තුලින් විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුවේ (Web of Universities Ranking) මුල් 13000 අතරට පැමිණීම අපේක්ෂා කර තිබුණු නමුත් 2016 මැයි 31 දිනට ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම ස්ථානය 14236 සිට 15362 දක්වා ස්ථාන 1126 කින් හා දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2013, 2014 හා 2015 වර්ෂවල ස්ථානය පිළිවෙලින් 17,19 හා 20 වන ස්ථානය දක්වා පහළ බැස තිබුණි.

(ඈ) දැනුම් සහ තොරතුරු අවශ්‍යතා සඳහා විශ්වවිද්‍යාලයේ පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීමේ අරමුණ අනුව ශිෂ්‍යයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පුස්තකාලය භාවිතයේ අපේක්ෂිත අගය සියයට 60 ක් වුවත් එය 2015 වර්ෂය අවසානයේදී සියයට 46.5 ක අගයක් ගෙන තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පිළිවෙලින් ශිෂ්‍යයින් 1956 ක් හා 1900 දෙනෙකු වෙනුවෙන් රු.534,096,538 ක් හා රු.457,802,863 ක පුනරාවර්තන වියදම් දැරීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු.273,055 ක් හා රු.240,949 ක් විය.මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.32,106 කින් වැඩිවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන් 550 දෙනෙකුගෙන් සිසුන් 09 දෙනෙකු එනම් සියයට 1.6 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

8

(උ) 2013-2017 සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 11 කට සිසුන් 850 දෙනෙකු බඳවාගත යුතු වුවත් සිසුන් 550 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 300 ක් ලියාපදිංචි වී නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 10 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: 5/0183/035/001 යටතේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසීම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වන නමුත් රාජ්‍ය විගණනය විසින් 2015 වර්ෂයේ නිකුත් කළ විමසුම් 05 කට 2016 මැයි 31 දින වනවිටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.6,650,000 ක අයවැයගත මූලධන ප්‍රතිපාදනයෙන් රු.1,480,495 ක් උපයෝජනය කර තිබීමෙන් රු.5,169,505 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 78 ක් විය.

(ආ) උසස් පෙළ නව තාක්ෂණ විෂය ධාරාවට ගැලපෙන පරිදි තාක්ෂණ උපාධි පාඨමාලාවක් ස්ථාපිත කිරීම සඳහා 2015 වර්ෂයේ රු.25,000,000 ක අයවැයගත මූලධන ප්‍රතිපාදන වෙන්වී තිබුණද රු.745,162 ක් උපයෝජනය කර තිබීමෙන් රු.24,254,838 ක් එනම් වෙන්වූ ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා 2014 දෙසැම්බර් මාසයේ විශ්වවිද්‍යාලයට ලබාදී තිබූ රු.3,323,020 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණු බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සතුටුදායක ප්‍රගතියක් නොතිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂවල බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රු. 2,000,000 ක පමණ මුදලක් පාඨමාලා ආරම්භ කිරීමේ කටයුතුවලට යෙදවීමකින් තොරව ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගත් රු.322,560 ක සේප්පු 05 ක් 2015 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩපල සඳහා මිලදී ගත් විවිධ කාර්යයන් සඳහා භාවිතා කළ හැකි රු.14,060,480 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට දැව භාවිතයෙන් සිදුකළ ප්‍රදර්ශනාත්මක කාර්යයන්ට පමණක් භාවිතා කිරීමෙන් මෙම යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනීමට 2013 වර්ෂයේ මිලදී ගත් රු.222,768 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංගය ප්‍රයෝජනයට නොගෙන භාවිතයෙන් ඉවත් කර තිබුණි.

4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ අංක 08 හා 2006 ජනවාරි 25 දිනැති උපදෙස් සංග්‍රහයේ හා ICTAD SBD/01 ඡේද 33.6 අනුව ඉදිකිරීම් පිරිනැමීමෙන් පසුව සේවාදායක ආයතනය හා කොන්ත්‍රාත්කරු අතර ලිඛිත ගිවිසුමක් ඇතිකරගත යුතු වුවත් විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම්, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ලබාදීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

විශ්වවිද්‍යාලයේ පීඨයන්හි අනුමත මහාචාර්ය තනතුරු 10 ක් හා සත්ත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 180 න් 40 ක පුරප්පාඩු පැවති අතර කළමනාකරණ පීඨයේ කථිකාචාර්යවරු 07 ක අතිරික්තයක් පැවතුණි. තවද 2006 ජුනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 70 කට නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

AGDSL

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචිත වර්ෂයට පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (2) ප්‍රකාරව විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකරන ලද්දේද යන්න තහවුරු කර ගැනීමට මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) හා 4.2.2 ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05 කට වෙන්කළ ප්‍රතිපාදන වලින් සියයට 4 සිට සියයට 66 දක්වා වූ විචලනයන් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 09 කට වෙන්කළ ප්‍රතිපාදනවලින් සියයට 15 සිට සියයට 97 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද

2012 සැප්තැම්බර් 21 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අප පලය ප්‍රතිචක්‍රියකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත්ව තිබුණි.

AGDSL

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත විටින්විට දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳුනු ගිණුම් පැවතීම.
(ආ) වත්කම් කළමනාකරණය	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම.
(ඇ) ගබඩා පාලනය	දුර්වල තොග කළමනාකරණය. තොග මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකිරීම
(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය	තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම.
(ඉ) කාර්යසාධනය	අපේක්ෂිත අරමුණු කරා ළඟා නොවීම
(ඊ) අයවැය ලේඛනමය පාලනය	ඇස්තමේන්තු හා සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

7.13 විගණකාධිපතිතුමාගේ වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

	අවසන් විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු	අදාල කෙටුම්පත් වාර්තාව සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති පිළිතුරු (වර්තමාන)	වර්තමාන තත්ත්වය
	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 114,130,385.00 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	එකග වෙමි. මෙම නිරීක්ෂණය තුළ සඳහන් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කොට නැවත ගිණුම් වලට ගැනීමට කටයුතු කරමි.	විශ්වවිද්‍යාලයේ සියලුම ජංගම නොවන (ස්ථාවර) වත්කම් වල කේතකරණය (coding) සිදු වෙමින් පවතින අතර, එය අවසන් වූ වහාම ප්‍රත්‍යාගණනය කොට ශුන්‍ය අගයන් සහිතව පොත් වල සඳහන් වත්කම් නැවත ගිණුම් වලට ගැනීමට කටයුතු කරන්නෙමු.
2.2.2	**ගිණුම්කරණ අඩුපාඩු**		
(අ)	රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ මිළ දී ගැනීම සඳහා දරනු ලබන වියදම අදාල වර්ෂයේ වියදමක් ලෙස ලියා හැරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 12,231,211.00 ක් වූ ඉතිරි තොගය ගිණුම් ගත කර නොතිබුණි.	නිරීක්ෂණය තුළ සඳහන් රු. 3,312 569.00 2015 වර්ෂයේ වීදුරු උපකරණ හා රසායන ද්‍රව්‍ය මිළදී ගැනීමට කරන ලද වියදමයි. භාවිත කල වීදුරු උපකරණ වටිනාකම වියදමක් ලෙස අය කිරීම නිවැරදි වේ. නමුත් භාවිත නොකල රසායනික ද්‍රව්‍ය හා වීදුරු උපකරණ වියදමක් ලෙස අය කිරීම නිවැරදි නොවන බව පිළිගනිමි. මෙහිදි සිදුව ඇත්තේ අතීත වර්ෂ කිහිපයක සිට භාවිතයේ පවතින තොග නිකුත් කිරීමේ පරිචයන්ට අනුව, වියදමක් ලෙස හඳුනාගනුයේ ඒවා ගබඩාවෙන් විද්‍යාගාර වලට නිකුත් කරන විටයි. නිකුත් කර ඇත්තේ භාවිත නොකර පවතින රසායනික ද්‍රව්‍ය හා වීදුරු උපකරණ තොග වටිනාකම් නැවත අගය කොට වත්කම් තොග යටතේ ගිණුම් වල ඉදිරිපත් කිරීමට ඉදිරියේ දි කටයුතු කරමි.	වර්ෂය තුළ මිළදී ගන්නා සියලුම රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ අදාල වර්ෂය සඳහා වියදමක් ලෙස කපා හැරීම පිළිබඳ ගිණුම්කරණ පරිචය වෙනස් කරමින් 2016 ගිණුම්කරණ වර්ෂයේ සිට ඉතිරි තොග ගිණුම් වාර්තා තුළ ජංගම වත්කම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.
(ආ)	සමාලෝචිත වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වෙනුවෙන් ගෙවූ රු. 539,200.00 ක නීති වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.	මෙහි සඳහන් රු. 615,450.00 ක නීති වියදම් තුළ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය මගින් විභාග කළ අභියාචනාවකට අදාලව ලබා ගත් නීති ගාස්තු වෙනුවෙන් ගෙවූ රු 76,250.00 ක් ඇතුලත් වේ. මෙය අයභාර වියදමක් ලෙස සැළකිය හැක. ඉතිරි මුදල වූ රු 539,200.00 ක් විශ්වවිද්‍යාලය සතු ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවූ මුදල් ඇතුලත්ය. මෙය පහත ජ'නල් සටහන මගින් 2016 ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරමි. ඉඩම් අත්පත් කර ගැනීමේ ගිණුම - හර පොදු සංචිතය - බැර	2015 ගිණුම් වර්ෂය තුළ රු. 539,200.00 ක් වූ ඉඩම් අත්පත් කරගැනීමේ දී දරන ලද නීති වියදම් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම ජ'නල් සටහනක් මගින් නිවැරදි කිරීම කර ඇත.

2.2.3	**පැහැදිළි නොකළ වෙනස්කම්**		
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව සත්‍යාක්ෂණය කරන ලද තොග ශේෂය හා මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර තිබූ තොග හා මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර තිබූ තොග ශේෂය අතර රු. 677,355.00 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම රු 677,355.00 ක් වූ භෞතික තොග සමික්ෂණ වාර්තාවේ ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග වටිනාකම අතර වෙනස සැසදීම් කිරිම සඳහා කටයුතු කරමි. මේ සඳහා භෞතික තොග සමික්ෂණ වාර්තා වල නිවැරදි බව නැවත පරික්ෂා කිරිමට අපේක්ෂා කරමි.	මේ සඳහා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක විසින් ද භෞතික තොග සත්‍යාපනයක් නැවත සිදු කල අතර, තව දුරටත් නෙසැසඳු ශේෂයක් ලෙස පවතී. තොග අධීක්ෂණය සඳහා 2016 වර්ෂය තුළ මෘදුකාංගයක් මිළ දී ගෙන ඇති අතර, මෙමඟින් ඉහත දුර්වලතා අවම කිරීමට/ වැලැක්වීමට කටයුතු කරන්නෙමු.
(ආ)	ගිවිසුම කඩ කළ නිළධාරීන්ගෙන් අය විය යුතු ශේෂ සම්බන්ධයෙන් ලබාගත් ශේෂ සනාථ කිරීම් හා මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂයන් අතර රු. 719,287.00 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම රු. 719,287.00 ක වෙනස වන්නේ ගිවිසුම් කඩ කළ නිළධාරීන්ගෙන් අයවිය යුතු සමස්ත ශේෂයන් සහ ගිවිසුම් කඩ කිරිම මත පමණක් අය කර ගත යුතු ශේෂයන් අතර වෙනසයි. මෙහිදි මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත්තේ ගිවිසුම් කඩ කිරිම මත අයවිය යුතු ශේෂ පමණකි. නමුත් මෙම වෙනස, එනම් ඔවුන්ගෙන් අයවිය යුතු වෙනත් ශේෂයන් ගිණුම් ගත කළ යුතු බව පිළිගනිමි. එම නිසා මෙම නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, එම වෙනස ගිණුම් ගත කිරිමට කටයුතු කරමි.	විගණන වාර්තාවේ සඳහන් රු. 719,287.00 ක වෙනසට හේතු වූ අත්හැරි ඇති ලැබිය යුතු "වෙනත් ශේෂයන්" පොත් වලට ගැනීමට කටයුතු කර ඇත.
(ඇ)	පර්යේෂණ කටයුතු සඳහා විවිධ පුද්ගලයන්ගෙන් ලැබුණ මූල්‍ය ප්‍රදාන වල වටිනාකම රු. 1,436,341.00 ක් බව විශ්වවිද්‍යාලය විසින් තහවුරු කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශන වල රු. 1, 131 ,952.00 ක් ලෙස දක්වා තිබුණි.	මෙය 2013 වර්ෂයේ සිට ගිණුම් වල පවතින ගිණුම්කරණ දෝෂයකි. එනම් 2013.12.31 දිනට පර්යේෂණ කටයුතු සඳහා විවිධ මුලාශ්‍ර වලින් වූ ලැබිම් (Research Grants) මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇත්තේ "තැන්පතු හා ගෙවිය යුතු දෑ" යටතේ වන අතර 2014 වර්ෂයේ ලෙජරය තුළ ආරම්භක ශේෂයන් සටහන් කිරීමේ දි එම ශේෂය "පර්යේෂණ ලැබිම්" ගිණුමට ආරම්භක ශේෂයක් ලෙස ගෙන නැත. නමුත් වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු සියල්ල නිවැරදිව සටහන් කර ඇත. නමුත් 2014.12.31 දිනට "පර්යේෂණ ලැබිම්" ගිණුමේ අවසාන ශේෂය එහෙයින් දෝෂ සහිත වේ. මෙම ශේෂය 2015 වර්ෂයේ මෙම ගිණුමේ ආරම්භක ශේෂය ලෙස සටහන් කොට 2015 වර්ෂයේ ගනුදෙනු ද නිවැරදිව සටහන් කොට ඇත. මෙම වෙනස අනාවරණ කොට නිවැරදි කිරිමට කටයුතු කරමි.	මෙම දෝෂය 2016 ගිණුම් වාර්තා තුළ නිවැරදි කර ඇත.
2.2.4	**විගණනය සඳහා සාක්ෂි නොවීම**		
	මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු එකතුව රු. 3,531, 671.00 ක් වටිනා පහත සඳහන් ගිණුම් විෂයන් 03ක් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට	එකඟ වෙමි. මෙම ශේෂයන් ලෙජර ගිණුමේ සමස්ථ ශේෂය වන අතර, කේවල ශේෂ ලැයිස්තුව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. කාල විශ්ලේෂණයක් සකස් කර	2015 වර්ෂය සඳහා වූ විගණන වාර්තාවේ සඳහන් මෙම නිරීක්ෂණයට සපයා ඇති පිළිතුරු වල එකඟ වූ පරිදි, තැන්පතු සඳහා කේවල ශේෂ ලැයිස්තු, කාල / වයස් විශ්ලේෂණයන් සකස්

	ඉදිරිපත් කර නොතිබුණි. ගිණුම් විෂය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකල සාක්ෂි ආපසු ගෙවිය යුතු තැන්පත් | 2,009,692 | ඉදිරිපත් නොකල සාක්ෂි ආරක්ෂක තැන්පත් | 879,553 | (ඉදිරිපත් නොකල සාක්ෂි) පොදු තැන්පත් - පුනරාවර්තන | 642,426 | කෝවල ශේෂ ලැයිත්තු, තැන්පත් ලේඛණ හා ශේෂ ලැයිස්තුව එකතුව | **3,531,671** |	නොමැති අතර එය නිවැරදිව සකස් කොට ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. විගණන නිරීක්ෂණ තුල සඳහන් "තැන්පත් ලේඛන" මගින් කුමක් අදහස් වේද යන්න අපැහැදිලිය.	කොට ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ)	2011 ජූලි 28 දින විශ්වවිද්‍යාලයට උප කුලපති ලෙස පැමිණි මහාචාර්යවරයාට 2011 ජනවාරි සිට ජූලි දක්වා වූ කාලයට අදාලව ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ගෙවා තිබුණු රු. 93,546.00 ක පර්යේෂණ දීමනා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.	එකඟ වෙමි. මෙම රු 93,546.00 ක පර්යේෂණ දීමනාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනිම සඳහා එම විශ්වවිද්‍යාලය වෙත වරින් වර සිහිකැදවීම් ලිපි 04 ක් යවා ඇත. නමුත් එම කිසිදු සිහිකැදවීමක් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලිඛිත ප්‍රතිචාරයක් ලැබී නොමැත. මෙය හිලව් කර ගැනීම සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂයක් ද පොත් වල නොමැත.	සපයා ඇති පිළිතුරු වල සඳහන් කර ඇති පරිදි මේ වන විටත් සිහිකැඳවීම් ලිපි 04 ක් යවා ඇත. ඊට අමතරව විද්‍යුත් තැපැල මඟින් හා දුරකථන ඇමතුම් මඟින් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත දන්වා ඇති අතර, තවදුරටත් අයවිය යුතු ශේෂයක් ලෙස පවතී.
(ආ)	2015 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් විස්තරයේ ඇතුළත් 2013 හා 2014 වර්ෂ වලට අදාළ රු. 38,000.00 ක බැංකු වැරදි හර කිරීම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම රු. 63,256.00 ක් වූ එකතුවෙන් රු. 38,000.00 ක් බැංකුව මඟින් සිදු වූ දෝෂයක් වන අතර, ඒවා නිවැරදි කිරීමට ලිපි මඟින් බැංකුව වෙත දන්වා ඇතත්, එය මෙතෙක් නිවැරදි කර නැත. මෙය තවදුරටත් අදාල බැංකුව සමඟ සාකච්ඡා කිරීම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. ඉතිරි වූ වෙනස එනම් රු. 25,256.00 කට අදාල දෝෂයන් සියල්ල 2016 වර්ෂය තුළ නිවැරදි කර ඇත.	රු. 38,000.00 ක එකතුවක් වූ බැංකුව මඟින් සිදු වූ දෝෂ, බැංකුව වෙත දන්වා නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
(ඇ)	බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම සම්බන්ධයෙන් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් රු. 8,440,058.00 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.	ගිවිසුම් කඩකර ඇති ආචාර්යවරුන්ගෙන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.	මෙම රු. 8,440,058.00 ක් වූ "බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම", මත ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් අය විය යුතු මුදල පිළිබඳව පහත පරිදි කටයුතු කර ඇත. I. M.A.R.N. පෙරේරා - රු. 1,674,835.50 ක ශේෂය තුළ ඇති රු.779,331.71 වූ මුදලක් අය කරගෙන ඇති අතර, ඉතිරිය වූ රු. 895,503.79 තව දුරටත් අයවිය යුතුව ඇත. මෙම මුදල ඔහුගේ විශ්වවිද්‍යාල දායක අරමුදල් (UPF) ශේෂයෙන් අයකර ගැනීමට එකඟතාව ලැබී ඇත. II. A.K.N.D. ප්‍රනාන්දු - රු. 6,

			765,222.99 ක ශේෂය අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව දන්වා ඇතත්, ඒ සඳහා ප්‍රතිචාරයක් ලැබී නැත.
(ඇ)	2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ විශ්ව විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටු කළ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ගෙවිය යුතු රු. 60,768,008.00 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	CECB ආයතනය (කොන්ත්‍රාත්කරු) විසින් අවශ්‍ය නිර්ණායකයන් සපුරා ඉල්ලුම් කර ඇති රඳවා ගත් මුදල් මේ වන විට නිදහස් කර ඇති අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වලට අදාලව ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය නොමැති නිසා අවසාන බිල්පත් ගෙවීමට නොහැකි වීම නිසාත්, උප ව්‍යාපෘති නිම කොට භාර දීමේ දි සිදු වු ප්‍රායෝගික ප්‍රමාදයන් නිසාත් මෙම ඉතිරිය සමස්ථ වශයෙන් සිදු වි ඇත. ඉතිරි මුදල් ද අවශ්‍යතා සපිරූ වහාම ගෙවීමට කටයුතු කරමි.	2006 – 2015 විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු කළ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) 2015.12.31 දිනට ගෙවිය යුතුව තිබූ රු. 60,768,008.00 ක මුදලෙන් රු. 38,251,587.84 ක මුදලක් ගෙවා ඇත. ඉතිරි මුදල වු රු. 22,516,420.16 ක් ප්‍රමාණය ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු (STC) අනුමැතිය නොමැති නිසා ප්‍රමාද වී ඇත.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

අවසන් විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු			අදාල කෙටුම්පත් වාර්තාව සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති පිළිතුරු	වර්තමාන තත්ත්වය
	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම		
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික කෙටුම්පත් වාර්තා සකස් කර ඇති අතර, විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි	අදාල කෙටුම්පත් වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
(ආ)	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 37(1) වගන්තිය	නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා පත් කළ යුතු නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව 2014 නොවැම්බර් 12 දින සිට උප කුලපතිවරයා විසින් පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු ලේඛකාධිකාරි වශයෙන් පත් කර 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,645,000.00 ක වැටුපක් හා දීමනා ගෙවා තිබුණි.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි තනතුර 2014.03.12 දින සිට පුරප්පාඩුව පැවති අතර, එම තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි වරුන් දෙදෙනෙකුට කාර්යයන් පවරන ලදි. එහෙත් එය පසුකාලීනව සාර්ථක බවක් පෙන්නුම් කර නොමැත.එබැවින් ඒ.ජී. කරුණාරත්න මහතා 2014.11.19 වන දින පැවැත් වු පාලක සභා තීරණය මත මාස 03 ක කාලයකට පැවරුම් පදනම මත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි තනතුරට පත් කරන ලදි. ඔහුට ලබාදෙන දීමනාව ගණනය කර ඇත්තේ ඔහු අවසන් වරට සේවය කල රජරට විශ්වවිද්‍යාලයේ මුල්‍යාධිකාරි විසින් එවා ඇති වැටුප් විස්තරය පදනම්ව අවසන් වරට ලැබූ වැටුප් පියවර සහ	පුරප්පාඩු ගත ලේඛකාධිකාරි තනතුර සඳහා 2014.05.11 දින පුවත්පත් දැන්වීම් මගින් ඉල්ලුම් පත් කැඳවූ අතර, මූලික අවශ්‍යතා සපුරා තිබූ අයදුම්කරුවකු 2015.03.04 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ පාලක සභාවේ නියෝජිතයන්ගෙන් සමන්විත තේරීම් මණ්ඩලයේ නිර්දේශය වූයේ අදාළ අයදුම්කරු ලේඛකාධිකාරී තනතුර සඳහා ප්‍රවීනතාව නොලැබූ බැවින්, නැවත අයදුම්පත් කැඳවිය යුතු බවයි. ඒ අනුව 2015.09.06 දින නැවත පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවූ අතර, ඒ සඳහා සුදුසුකම් සපිරූ අයදුම්පත් 02 ක් ලැබුණි. නමුත් ඔවුන් ම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවිය. නැවත පාලක සභාවේ අනුමැතිය මත 2016.12.04 දින පුවත්පත්

			ඊට අමතරව ලබා ඇති දීමනා සලකා බලා බැව් සඳහන් කරනු කැමැත්තෙමි. තවද අනුයුක්ත වාහනයක් භාවිත නොකිරීම හා ඉන්ධන දීමනා ලබා නොගැනීම තුළින් විශ්වවිද්‍යාලයට මූල්‍යමය වාසියක්ද සැලසී ඇත.	දැන්වීමක් මඟින් අයදුම් පත් කැඳවූ අතර, ඒ සඳහා ද කිසිදු අයදුම්පතක් ලැබී නොමැත. මෙම තත්ත්වය පාලක සභාව වෙත වාර්තා කරන ලද අතර, මේ තත්ත්වය සලකා බැලූ පාලක සභාව තිරණය කරන ලද්දේ සේවා අවශ්‍යතා මත මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර ලේඛකාධිකාරීවරයෙක් ස්ථාවරව පත්කර ගන්නා තෙක් විශ්වවිද්‍යාල සේවයේ වසර 15 කට වඩා වැඩි කාලයක් ලේඛකාධිකාරීවරයෙක් වශයෙන් සේවයේ නියුතුව සිටි නිළධාරියෙක් පැවරුම් පදනම මත පත් කොට සේවයේ යොදවා ගන්නා බවයි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
	(i) මුදල් රෙගුලාසි 139	සහතික කිරීමේ නිළධාරියා විසින් සහතික කරන ලද වවුචර් වලට පමණක් ගෙවීම් කළ යුතු වුවද, ඊට පටහැනිව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට සමාලෝචිත වර්ෂයේ දී රු. 2,814,378.00 ක මුදලක් ගෙවා තිබුණි.	එකඟ වෙමි. මෙය වර්ෂය අග කළ ගෙවීමක් වන අතර, ගෙවීම් රාශියක් එකවර සහතික කිරීමේ දි ප්‍රමාද දෝෂයකින් මෙය අත්හැරී ගොස් ඇත. මෙවැනි දෝෂයන් ඉදිරියේ දි සිදු නොවන ලෙස වග බලා ගැනීමට අදාළ නිළධාරින්ට උපදෙස් ලබාදෙමි.	මෙවැනි දෝෂයන් සිදු නොවීමට වග බලා ගැනීමට අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	(ii) මුදල් රෙගුලාසි 156	සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා කාල පරිච්ඡේදය තුළ දී සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් නිසි වේලාවට නොගෙවීම නිසා රු. 70,347.00 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුන අතර, එම මුදල ඊට වගකිව යුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	රු. 2024.00 ක් සහ රු. 9,675.00 ක් වන අධිභාර මුදලක් ගෙවීමට සිදු ව ඇත්තේ සේවක භාරකාර අරමුදලට අදාල වු සම්මත ප්‍රේෂණ පත්‍ර ආකෘතිය නිසි වේලාවට නොලැබීම හේතුවෙනි. මෙය කිහිප වතාවක දීම සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දැන්වූ නමුත්, එම ආකෘතිය ලබා ගත නොහැකි වු අතර, පෙර මාසයකට අදාල ආකෘතියක ඡායා පිටපතක් පිරවීම මඟින් ප්‍රමාදයක් සහිත ප්‍රේෂණ පත්‍රය යවා ඇත.	රු. 2,024.00 ක් හා රු. 9,675.00 ක් වන අධිභාර මුදල් ගෙවීමට සිදුවූයේ සේවක භාරකාර අරමුදල සම්මත ප්‍රේෂණ පත්‍ර ආකෘතිය එවීමට ප්‍රමාද වීම මත නිසා එය නැවත අය කර ගැනීමට එම අරමුදල වෙත දන්වා ඇත. අධිභාරය මත ගෙවීමට වන අධිභාරය වැලැක්වීම සඳහා ඉහත මුදල ගෙවීමට කටයුතු කර ඇත. 2016 හා 2017 වර්ෂ සඳහා, එම වර්ෂයන් ආරම්භයේ දීම එම ආකෘතින් ලැබී ඇති හෙයින් එලෙස අධිභාරයක් ගෙවීමට එම වර්ෂ වල දි සිදු වි නැත.

			රු. 7,203.00 රු. 42,146.00 ක් හා රු. 9,299.00 වු අධිහාර මුදල් ගෙවීමට සිදුවී ඇත්තේ, එවකට මෙම ගෙවීම් සකස් කළ පුහුණුවන්නන් ඔවුන්ගේ නොසැළකිලිමත් කම නිසාය. අදාළ චෙක්පත් අරමුදලට නිසි දිනට ප්‍රේෂණය නොකොට අත්හැරීම හේතුවෙනි. මෙම කාලය තුළ මෙම අංශයෙහි ස්ථිර සේවකයන් නොසිටි අතර, සියලුම කටයුතු පුහුණුවන්නන් මඟින් ඉටු කර ගෙන ඇත. මෙම අධිහාර මුදල ගෙවීම සඳහා විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ හා පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත.	පුහුණු වන්නන්ගේ නොසැළකිලිමත් කම නිසා ගෙවීමට සිදු වූ රු. 58,648.00 ක් වු අධිහාරය වැනි දෑ වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වර්තමානයේ දී ගෙන ඇත.
	(iii) මුදල් රෙගුලාසි 371 (2)	නිළධාරීන් 4 දෙනෙකු විසින් ලබා ගත් රු. 234,912.00 ක අත්තිකාරම් එම කාර්යය නිම කළ වහාම පියවීමට කටයුතු නොකර ඒ සඳහා මාස 1 සිට 10 දක්වා වු කාලයක් ලබා ගෙන තිබුණි.	මෙයින් ඇතැම් අත්තිකාරම් සැපයුම් කරුවන්ට ලබා දුන් ඒවා වන අතර, සැපයුම් වල පවතින දෝෂයන් නිසා අවසාන ගෙවීම් ප්‍රමාද වීම මත අත්තිකාරම් පියවීමට ප්‍රමාද වී ඇත. අනෙකුත් අත්තිකාරම් යම් යම් ප්‍රායෝගික හේතූන් මත ගෙවා පියවීමට අපොහොසත් වී ඇත. කෙසේ වෙතත් ලබා දෙන අත්තිකාරම් මුදල් උපරිම ලෙස නියමිත කාලය තුළ පියවීමට නිළධාරීන් දැනුවත් කර ඇත.	2015.12.31 දිනට පැවති සියලුම නොපිය වු අත්තිකාරම් මුදල් 2016 පෙබරවාරි වන විට පියවා ඇති අතර, එවැනි නොපියවූ අත්තිකාරම් ශේෂයන් අවම කිරීමට වර්තමානයේ දී සිහිකැඳවීම් යැවීම මඟින් කටයුතු කරන්නෙමු.
(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ	පිරිවැය රු. 2,139,950,371.00 ක දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් විධිමත් පරිදි වත්කම් පන්තිය අනුව ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කර නොතිබුණ අතර, පිරිවැය රු. 32,850,376.00 ක පරිගණක මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ පාලන අංශය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යන අතර, දැනටමත් එම ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වට්ටෝරු ලේඛනයේ සටහන් කර ඇති අතර, පරිගණක සහ උපාංග වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යෑමට අදාළව නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු	2016 වර්ෂය තුළ දී "ස්ථාවර වත්කම් කළමනාකරණය" සඳහා පරිගණක මෘදුකාංගයක් මිළ දී ගෙන ඇති අතර, එම මෘදුකාංගය තුළ "ස්ථාවර වත්කම් ලේඛණය" නම් වු මොඩියුලය ඇති අතර, පරිගණක මෘදුකාංග හා දෘඪාංග පිළිබඳ ලේඛණය ද ඒ තුළ ඇත.

			කරමි.	
(ඉ)	2003 ජූනි 03 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 7.1 හා 7.2 ඡේදය.	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය පරිදි මෙහෙයුම් අත් බපොත් පිළියෙල කර නොතිබුණි.	ඉදිරියේ දි ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අත් පොත් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරමි.	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිළධාරින් කළ යුතු රාජකාරී වලට අදාල ලැයිස්තු පවරා ඇති අතර, එම රාජකාරී ලැයිස්තු තුළ ඒ ඒ නිළධාරියා කළ යුතු රාජකාරී පැහැදිළිව සඳහන් කර ඇත. ඊට අමතරව සේවා අවශ්‍යතා මත ආයතන ප්‍රධානියා සහ අංශ ප්‍රධානියා පවරන රාජකාරී ඉටුකිරීමට නිළධාරියා බැඳේ.
(ඊ)	2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෝෂ්ඨ නිළධාරීන්ට හිමි නිවාස වල හා තනිකඩ බද්ධ නිවාස වල පදිංචි නිළධාරීන්ගෙන් නිවාස කුලී චක්‍රලේඛ ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අගනුවරින් බැහැරව පිහිටි ආයතනයක් වන අතර, අධ්‍යයන සහ පරිපාලන කාර්යය මණ්ඩල ජ්‍යෝෂ්ඨයන් බඳවා ගැනීම සහ රඳවා ගැනීමේ දී විශාල ගැටළුවකට මුහුණ දීමට සිදුව ඇත. කෙසේ වුවද නිවාස ප්‍රශ්නය ආචාර්යවරුන් බඳවා ගැනීමේ දී සහ රඳවා ගැනීමේ දී බලපාන විශේෂ ගැටළුවක් වුව ද, ලබන වසරේ සිට සුදුසු නිවාස කුලියක් අය කර ගැනීමට විශ්වවිද්‍යාල පාලක සභාව මඟින් කටයුතු යොදා ඇත.	විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ හා පරිපාලන අංශ නියෝජනය වන පරිදි නිවාස කමිටුවක් පත්කොට නිල නිවාස සඳහා සුදුසු නිවාස කුලී ඇතුළත් වාර්තාවක් 2016.12.01 දින පැවති 117 පාලක සභාවට ඉදිරිපත් කල අතර, සවිස්තර වාර්තාවක් ලබා ගැනිමෙන් පසු නිවාස කුලී අය කිරීමට කටයුතු කරනු ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 97,665,336.00 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 59,812,116.00 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 37,853,220.00 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනය රු.16,669,000.00 කින් වැඩි වුවද සේවක පරිශ්‍රමික රු. 54,213,376.00 කින් වැඩි වීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.	මෙම නිරීක්ෂණය තරමක් අපහැදිළිය. මෙහි දී මෙහෙයුම් කටයුතු වලින් සිදුවී ඇති ඌණතාවය රු. 441, 036,336.00 බවත්, තවත් වරෙක එය රු. 97,665,336.00 බවත්, සඳහන් වී ඇත. අප ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය සඳහා ඌණතාවය රු. 97,665,336.00 ක් වේ.	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියා මාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.

	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ඌණතාවයක් ඇති වී තිබුණි. සේවක පරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැළකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී දායකත්වය වැඩි වී තිබුණු අතර, 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දී දායකත්වය අඩු වී තිබුණි.කෙසේ වුව ද 2013 වර්ෂයේ දී රු. 113,423,662.00 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු. 254,823,688.00 ක් දක්වා වර්ධනය වී තිබුණි.	මෙම නිරීක්ෂණය අනුව ඒ ඒ වර්ෂයේ ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය) ට සේවක පාරිශ්‍රමිකය හා ක්ෂයවීම් නැවත ගලපා ඒ ඒ වර්ෂයේ එකතු කළ අගය නැතහොත් දායකත්වය ලබා ගෙන ඇත. එහිදි 2013 වර්ෂයේ ඌණතාවය ඉහළ අගයක් ගැනිම නිසා එම වර්ෂයේ එකතු කළ අගය සාපේක්ෂව අඩු අගයක් ගනි. 2011 ට සාපේක්ෂව 2015 වර්ෂයේ එකතු කළ අගයෙහි රු. 142, 844, 513.00 ක ප්‍රමාණාත්මක වර්ධනයක් පැවතීමට ප්‍රධාන හේතුව වන්නේ සේවක පාරිශ්‍රමිකයේ හා ක්ෂයවීම් වල සාපේක්ෂ වර්ධනයත්, ශුද්ධ ඌණතාවයෙහි ප්‍රමාණාත්මක වර්ධනයත් යන කරුණු වල ශුද්ධ බලපෑම නිසයි.	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.
3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය			
(අ)	2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී රජයේ ප්‍රදාන හා විලම්භිත ආදායම් හැර ආදායම් සියයට 12 කින් ද ක්ෂය වීම් හැර වියදම් හා ඌණතාවය සියයට 17 කින් ද රජයේ ප්‍රදාන සියයට 5 කින් ද වැඩි වී තිබුණි.	i. ආදායම් (රජයේ ප්‍රදාන හා විලම්භිත ආදායම් හැර) විගණන නිරීක්ෂණය අනුව ආදායම් ප්‍රකාශයේ ඉහත ආදායම් ශීර්ෂය පොදු ප්‍රමාණගත කිරීම් වලට (common sizing of Financials) අනුව 12% වර්ධනයක් පෙන්නුම් කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වි ඇත්තේ “ස්ව මූල්‍යනය වැඩ සටහන්” (Self Fenance Programmes) වලින් ලැබූ ආදායම් වල 400% ක් වූ වාර්ෂික වර්ධනයක් “වෙනත් ආදායම්” වල 10% ක් වූ වාර්ෂික වර්ධනයක් හේතුවෙනි. ii. වියදම් (ක්ෂය හැර) මෙම ශීර්ෂය සඳහා වාර්ෂික වර්ධනය 17% ලෙස විගණනයේ දී නිරීක්ෂණය වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ “සේවක පාරිශ්‍රමිකය” ශීර්ෂයෙහි සිදු වි ඇති 34% ක් වූ සාපේක්ෂ වර්ධනයත් හා “ගිවිසුම් ගත වියදම්” වල සිදුවි ඇති 9% ක අඩුවීමත් ය. මේ යටතේ ගැනෙන අනෙකුත් වියදම් ශීර්ෂයන්ගේ වර්ධනයක් සිදුවි ඇතත්, එය ප්‍රමාණාත්මක නොවේ. රජයේ ප්‍රදාන (Government Grants) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ 5% වර්ධනයක් නිරීක්ෂණය වි ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන්	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.

		හේතු වි ඇත්තේ 2015 වර්ෂයේ විශ්වවිද්‍යාලය සඳහා අයවැයෙන් වෙන්වූ ප්‍රතිපාදන වල වැඩිවීමයි.	
(ආ)	ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සියයට 120 කින් වර්ධනය වී තිබූ අතර කාරක ප්‍රාග්ධනය සියයට 55 කින් අඩු වී තිබුණි.	විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය යටතේ මූල්‍ය තත්ත්වයට අනුව ජංගම වත්කම් වල වර්ධනය 120 ක් බව විගණනයේ දී නිරීක්ෂණය වී ඇත. මේ සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ජංගම ගිණුම් ශේෂයන් ආයෝජන තොග හා ලැබිය යුතු ගිණුම් වල වර්ධනය හේතු වී ඇති බව තවදුරටත් විගණනයෙ දී නිරීක්ෂණය වී ඇත .	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.
(ඇ)	ඉකුත් වර්ෂයේ දී ජංගම වගකීම් වලට ජංගම වත්කම් 3:1 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දී ජංගම වත්කම් වල සිදුවූ ඉහළ යාම හේතු කොට ගෙන ජංගම වගකීම් වලට ජංගම වත්කම්1:4:1 ක් වී ජංගම අනුපාතයේ 1:6 ක වර්ධනයක් පෙන්නුම් කළ ද එය ප්‍රශස්ථ මට්ටම වූ ජංගම වගකීම් වලට ජංගම වත්කම් 1:2 මට්ටමට ළඟා වී නොතිබුණි.	විගණනයේ දි නිරීක්ෂණය වී ඇති පරිදි ජංගම අනුපාතයෙහි සිදුවී ඇති ප්‍රමාණාත්මක වර්ධනය මඟින් විශ්වවිද්‍යාලයේ කෙටි කාලීන ද්‍රවශීලතාවයෙහි වර්ධනයක් සිදුවී ඇතත්, එය සම්මත / ප්‍රශස්ථ මට්ටම (bench mark/ceiling/cutoff) වන 1:1 අනුපාතයට ළඟා වී නොමැත. නමුත් රාජ්‍ය ප්‍රදාන වලින් ප්‍රධාන වශයෙන් නඩත්තු වන විශ්වවිද්‍යාලයක් වැනි ආයතනයක ජංගම අනුපාතයෙහි සම්මත අගය නිශ්චිතව ඉදිරිපත් කළ නොහැක.	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.
(ඈ)	2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය සියයට 23 කින් අඩු වී තිබූ අතර, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහ පිළිවෙලින් සියයට 11 හා සියයට 18 කින් වර්ධනය වී තිබුණි. වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල සියයට 325 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.	මුදල් ප්‍රවාහ යටතේ පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ දි මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ප්‍රමාණාත්මක වර්ධනයක් පෙන්නුම් කිරීමට ප්‍රධාන හේතුව වන්නේ බැංකු ගිණුම් වල පැවති මුදල් ශේෂයන් ගේ පෙන්නුම් කළ 450% ක් වූ වර්ධනයයි.	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/ සාමාලෝචනයක් වේ.
4. මෙහෙයුම් සමාලෝචනය **4.1 කාර්යය සාධනය**			
විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ සැලැස්මේ ළඟා කර ගැනීමට අපේක්ෂිත උපාය මාර්ගික ඉලක්ක 14 ක් සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව උපාය මාර්ගික ඉලක්ක 2015 වර්ෂය අවසානය වන විට අපේක්ෂිත තත්ත්වයට ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණ අතර, මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.			
(අ)	ලෝකයේ ඉල්ලුමට සරිලන පරිදි සුදුසුකම් හා සමාජ අගයන් වැඩි දියුණු කිරිම හා වෙනස් වන කාර්මික අවශ්‍යතාවයන් ට අනුකූල වන ලෙස සියලු උපාධි පාඨමාලා වල විෂයමාලා වන් සංශෝධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම තුළින් උපාධිධාරීන් ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 80 මට්ටමට ළඟා කර ගැනීම අපේක්ෂා කර තිබුණු 2015 වර්ෂයේ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ උපාධිධාරීන් ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 73 ක් දක්වා පහළ බැස තිබුණි.	විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශය මඟින් විශ්වවිද්‍යාලයෙන් ඉවත්වන උපාධිධාරීන් ගේ සේවා නියුක්තිය මනිනු ලබන්නේ ඔවුන්ගේ උපාධි ප්‍රදානෝත්සවයට පෙර උපාධි ලෝගු භාර දෙනු ලබන කාල සීමාවේ දී ය. එනම් උපාධිධාරීයා විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී පළමු මාස 6 තුළ දී ය. මෙම ක්‍රමවේදය වෙනස් වීම තුළින් නිවැරදි සේවා නියුක්ති ප්‍රතිශතයක් ලබා ගත හැකි වේ. එනම් උපාධිධාරියාගේ උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු පළමු මාස 6 සම්පූර්ණ වීමේ දී සේවා නියුක්තිය හා පළමු වර්ෂය සම්පූර්ණ වීමේ දී සේවා නියුක්තිය ලෙස වඩාත්	උපාධි ප්‍රදානෝත්සවයෙන් පළමු මාස 06 තුළ සිදුකරන සමීක්ෂණයට අමතරව මේ වන විට උපාධි ප්‍රදානෝත්සවයෙන් අවුරුද්දකට හා අවුරුදු 02 කට පසු වශයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමීක්ෂණ 02 ක් සිදු කිරීමට තීරණය කර තිබේ. එම සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, ඒ සඳහා උපාධිධාරීන් වෙත තැපැල් කරනු ලැබූ ප්‍රශ්ණාවලි සඳහා පිළිතුරු ලැබෙමින් පවතී.

		යථාකාලීන මිණුම් දණ්ඩක් ගැනීමයි. මේ සඳහා දැනටමත් වෘත්තීය මාර්ගෝපදේශන අධ්‍යක්ෂ සමඟ සාකච්ජා කර ඒ පිළිබඳ කටයුතු කරමින් පවතී.	
(ආ)	විද්‍යාව, තාක්ෂණය, කෘෂිකර්මය හා කළමනාකරණ උසස් අධ්‍යාපනය සඳහා විදේශ සිසුන්ගේ සහභාගීත්වය යන අරමුණු ඉටු කර ගැනීම තුළින් විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත විදේශ ශිෂ්‍ය ලියාපදිංචිය මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1 ක් වුවත් 2015 වර්ෂයේ ලියාපදිංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විදේශ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 0.54ක් වී තිබුණි.	දැනට අධ්‍යාපනය ලබන විදේශිය ශිෂ්‍යයන් පැමිණ ඇත්තේ ජනාධිපති ශිෂ්‍යත්වය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහාය. මේ වන විට විශ්වවිද්‍යාලය වඩාත් ජනප්‍රිය කරවීමට විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වඩා ආකර්ෂණීය බවට පත් කිරීමට කටයුතු කරමින් පවතී.	වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ විදේශ සිසුන් 04 ක් අධ්‍යයන කටයුතු වල නිරත වෙන අතර, මෙම සිසුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා සිදු කරනු ලබයි.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලෝක ඉල්ලුමට සරිලන පරිදි උපාධි පාඨමාලා වල ශික්ෂණය වර්ධනය කිරීම, පර්යේෂණ හා ඉගැන්වීම් වල තත්ත්වය වර්ධනය කිරීම හා ඉගැන්වීමට, ඉගෙන ගැනීමට හා පර්යේෂණ සඳහා වඩා උසස් යටිතල පහසුකම් ඇති කිරීම යන අරමුණු ඉටු කර ගැනීම තුළින් විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුවේ (Web of Universities Ranking) මුල් 13000 අතරට පැමිණීම අපේක්ෂා කර තිබුණු නමුත්, 2016 මැයි 31 දිනට ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම ස්ථානය 14236 සිට 15362 දක්වා ස්ථාන 1126 කින් හා දේශිය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2013, 2014 හා 2015 වර්ෂ වල ස්ථානය පිළිවෙලින් 171920 වන ස්ථානය දක්වා පහළ බැස තිබුණි.	විශ්වවිද්‍යාලයේ අන්තර්ජාලයේ විශ්වවිද්‍යාල අංකනය (Webometric Ranking of University) ඉහළ දමා ගැනීමට දැනටමත් කටයුතු සලසා ඇත. මේ සඳහා උප කුලපතිතුමා විසින් විශේෂිත වු කණ්ඩායමක් ස්ථාපිත කර ඇති අතර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු එහි කණ්ඩායම් නායකයා ලෙස පත් කර ඇත. එම කණ්ඩායම විසින් විශ්වවිද්‍යාලයේ Webometric අංකය ඉහළ දමා ගැනීමට අවශ්‍ය විශේෂ පියවර දැනටමත් ගනිමින් පවතී. එමෙන්ම උපාධි පාඨමාලා වල ගුණත්වය වැඩි කිරීමට හා සේවා යෝජකයන් ගේ අවශ්‍යතාවන්ට වඩාත් හොඳින් ගැලපෙන ලෙස උපාධි පාඨමාලා සංශෝධනය කිරීම විවිධ ඉගැන්වීමේ ක්‍රම (Student Centered Learning Methods) භාවිතය අඛණ්ඩව අනුගමනය කරයි. ගුණාත්මක භාවය වැඩි කිරීමේ අධ්‍යාපන ක්‍රියාකාරකම් වලට අමතරව පරිබාහිරව ක්‍රියාකාරකම් අඩංගු විය යුතුයි. ක්‍රීඩා කටයුතු, පහසුකම්, සිසුන්ගේ නේවාසික පහසුකම් වැඩි කිරීම හා අනෙකුත් විනෝදාත්මක කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ඉදිරියේ දී වැඩි කිරීමට කටයුතු කරනු ලැබේ. විද්‍යාගාර 32 කට අදාල විද්‍යාගාර උපකරණ හා රසායනික ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලැබෙන පරිදි කටයුතු යොදා ගෙන යනු ලැබේ. අධ්‍යයන හා අනධ්‍යයන දෙපාර්ශවයටම පර්යේෂණ කාර්යයන් සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.	2017.03.16 දිනට වන විට විශ්වවිද්‍යාලයේ අන්තර්ජාලයේ විශ්වවිද්‍යාල අංකනය (Webometric Ranking of University) තුළ ලෝක ශ්‍රේණි ගත කිරීම් වල 10911 වෙනි ස්ථානය දක්වා ඉහළ ගොස් ඇති අතර, දේශිය ශ්‍රේණි ගත කිරීම් වල 18 වන ස්ථානය දක්වා ඉදිරියට පැමිණ ඇත.
(ඈ)	දැනුම් සහ තොරතුරු අවශ්‍යතා සඳහා විශ්වවිද්‍යාලයේ පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීමේ අරමුණ අනුව ශිෂ්‍යයන් ගේ හා කාර්යය මණ්ඩලයේ පුස්තකාලය භාවිතයේ අපේක්ෂිත අගය සියයට 60 ක් වුවත්, එය 2015 වර්ෂය අවසානයේ සියයට 46.5 ක අගයක් ගෙන	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල යෙහි 2015 වසරෙහි පුස්තකාල භාවිත අගය 46.5% බව විගණන වාර්තාවේ සඳහන් කර ඇත. මෙම අවසන් නිගමනය සඳහා දත්ත ලබා ගෙන ඇත්තේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල යෙහි පුස්තකාල පරිශීලන වාර්තාව තුළිනි. මෙම වාර්තාව සාදනු ලැබූයේ පුස්තකාල කළමනාකරණයට අදාල	(I). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති ඊ සම්පත් දත්ත පදනම මඟින් පාඨක අවශ්‍යතාවන් සපුරා දෙනු ඇත. (II). පුස්තකාලාධිපති විමසුම් සේවාව යටතේ පාඨකයන්ගේ පර්යේෂණ

	තිබුණි.	තීරණ ගැනීම පහසු කරනු වස් භෞතික පුස්තකාලයේ පවතින තොරතුරු සම්පත් උපාධි අපේක්ෂකයන් විසින් භාවිතා කිරීම සම්බන්ධවයි. මෙම වාර්තාව තුළ වැඩි අවධානයක් යොමු කර ඇත්තේ පුස්තකාල තොරතුරු සංරචක කීපයක් සම්බන්ධව පමණි. උදාහරණ ලෙස භෞතික පුස්තකාලයේ පොත්, පර්යේෂණ නිබන්ධන, පසුගිය ප්‍රශ්න පත්‍ර පරිශීලනය යනාදියයි. විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය පුස්තකාලය භාවිතා කිරීම සම්බන්ධව දත්ත මෙහි අන්තර්ගත නොවේ. අන්තර්ජාලය හරහා හා විශ්වවිද්‍යාල පරිඝනක ජාල පද්ධතිය හරහා සිදු වන විද්‍යාත්මක සඟරා භාවිතය, පුස්තකාලාධිපති විමසුම් සේවය, පුවත්පත් පරිශීලනය වැනි සේවාවන්ට අදාල දත්තයන් ද මෙහි අන්තර්ගත නොවේ. එහෙයින් උක්ත එළඹීමේ දී මෙම සියලුම කරුනු පිළිබඳ අවධානය යොමු කළ යුතුය. තවද 2015 වසරෙහි අවසාන මාස තුනෙහි දී පුස්තකාල ගොඩනැගිල්ලේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් පුස්තකාලය භාවිත කිරීමේ යම් යම් ගැටළු පැන නැඟුන ද නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දිම තුළින් පුස්තකාල සේවාවන් කාර්යාක්ෂම කිරීම හා එමඟින් පුස්තකාල පරිහරණ අපේක්ෂිත මට්ටම පවත්වාගෙන යාමට ඉදිරියේ දි කටයුතු කරනු ලැබේ.	කටයුතු වලට අදාල තොරතුරු ලබා දීම පුස්තකාල විද්‍යුත් තැපැල මඟින් සිදුකරනු ලබයි. (III). පාඨක අවශ්‍යතා මත භාෂා තුනෙන්ම දෛනික හා සති අන්ත පුවත්පත් ලබා ගැනීම සිදුකරයි. (IV). 24 පැයම කියවීම් ශාලාව විවෘත කර තැබීම. (V). ශිෂ්‍යය පාඨකයන්ගේ පුස්තකාල කාඩ්පත් සඛ්‍යාව වැඩි කිරීම. (VI). පුස්තකාලයේ වැඩි වශයෙන් භාවිතා කරන පොත් පත් සංඛ්‍යාවේ අතිරේක පිටපත් වැඩි කිරීමට දැනටමත් කටයුතු කර ඇත.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පිළිවෙලින් ශිෂ්‍යයින් 1956 ක් හා 1900 දෙනෙකු වෙනුවෙන් රු. 534,096,538.00 ක් හා රු. 457,802,863.00 ක පුනරාවර්තන වියදම් දැරීම නිසා ඒක ශිෂ්‍යය පිරිවැය රු. 273,055.00 ක් හා රු. 240,949.00 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍යය පිරිවැය රු. 32,106.00 කින් වැඩි වී තිබුණි.	2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍යය පිරිවැය රු. 32,106.00 කින් වැඩිවිමට ප්‍රධාන හේතුව වන්නේ සිසුන්ගේ සංඛ්‍යාවෙහි වර්ධනයට වඩා වැඩි වර්ධනයක් අයභාර හා ප්‍රාග්ධන වියදම් වල සිදුවී ඇති නිසාය.	විගණන නිරීක්ෂණය මඟින් පෙන්වා ඇති ඒක ශිෂ්‍යය පිරිවැයෙහි රු. 32,106.00 ක වර්ධනය සඳහා හේතු වී ඇත්තේ, දී ඇති පිළිතුරු අනුව අය භාර හා ප්‍රාග්ධන වියදම් වල සාපේක්ෂ වර්ධනයයි. (දී ඇති පිළිතුරෙහි වෙනසක් නැත.)
(ඊ)	සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට බඳවා ගත් සිසුන් 550 දෙනෙකුගෙන් සිසුන් 09 දෙනෙකු එනම් සියයට 1.6 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.	රැකියාවක් ලැබීම සහ විදේශගත වීම හෝ වෙනත් පෞද්ගලික හේතූන් මත සිසුන් කිහිපදෙනෙකු පාඨමාලා හැරගොස් ඇත.	ඇතැම් සිසුන් රැකියා අවස්ථා සහ විදේශ ශිෂ්‍යත්ත්ව ලබා පාඨමාලා හැර යන අතර, ප්‍රායෝගිකව එවැනි තත්ත්වයන් වැලැක්විය නොහැක.
(උ)	2013-2017 සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 11 කට සිසුන් 850 දෙනෙකු බඳවා ගත යුතු වුවත්, සිසුන් 550 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාවෙන් 300 ක් ලියාපදිංචි වී නොතිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාල ශිෂ්‍යය බඳවා ගැනීම් සඳහා තෝරා ගැනීම් කරන බැවින්, අදාල පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට යෝජිත සමහර සිසුන් නොපැමිණීමත්, විවිධ පාඨමාලා සඳහා නිරන්තරයෙන් යාවත්කාලීන කිරිම් සිදුවන බැවින්, මෙවැනි පුරප්පාඩු වීම්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාල ශිෂ්‍යය බඳවා ගැනීම් කරන බැවින්, ඇතිවන තත්ත්වයන් සම්බන්ධයෙන් හැකිතාක් දුරට පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.

		ඇති වන බැව් සඳහන් කරමි.	
4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්			
(අ)	2008 පෙබරවාරි 10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 5/0183/035/001 යටතේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව විශ්වවිද්‍යාලයට වෙන් කර තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි.	කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට අයිතිව තිබූ ඉඩම් කට්ටි වල පදිංචිව සිටි 06 දෙනෙකු වන්දි ගෙවා ඉවත් කර ඇති අතර, ඉතිරි අයගෙන් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇති බැවින්, නීත්‍යානුකූලව ඉඩම් පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත.	බදුල්ල ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කොට සුදුසු වන්දියක් ගෙවා සාකච්ඡා මාර්ගයෙන් තීරණයකට එළඹීම සඳහා වන්දි කමිටුවක් පත් කරන ලෙස අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත.
(ආ)	මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසීම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීමට ප්‍රධාන ගණන් දීමේ නිළධාරියාගේ වගකීම වන නමුත්, රාජ්‍ය විගණනය විසින් 2015 වර්ෂයේ නිකුත් කළ විමසුම් 05 කට 2016 මැයි 31 වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.	ඔබගේ වාර්තාවේ දක්වා ඇති පිළිතුරු සපයා නොමැති විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් 5 න් 2 ක් සඳහා 2016.06.20 දින හා 2016.06.21 දින පිළිතුරු විගණකාධිපතිතුමා වෙත යවා ඇත. විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ කටයුතු හා අභියෝග්‍යතා පරික්ෂණයේ කටයුතු හේතුවෙන් මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු එවීමට ප්‍රමාද වූ අතර, ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි. තවද, ඉතිරි විගණන විමසුම් තුන සඳහා ද ඉතා ඉක්මණින් පිළිතුරු එවීමට කටයුතු කරමි.	2015 වර්ෂය සඳහා විගණන වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් 6 ලැබී තිබුන අතර, ඉන් විගණන විමසුම් 4 ක් සඳහා පිළිතුරු සපයා ඇති අතර, ඉතිරි විගණන විමසුම් 02 සඳහන් කරුණු සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අවසන් කෙටුම්පත් වාර්තාවේ පිළිතුරු සපයා ඇත.
4.3 අරමුදල් ඌණ උපයෝජනය			
(අ)	පර්යේෂණ දිරිමත් කිරීම සඳහා 2015 වර්ෂයේ දී රු. 6,650,000.00 ක අයවැය ගත මූලධන ප්‍රතිපාදනයෙන් රු. 1,480,495.00 ක් උපයෝජනය කර තැබීමෙන් රු. 5,169,505.00 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, එය මුලු ප්‍රතිපාදනයෙන් සියයට 78 ක් විය.	2015 වර්ෂයේ දි පර්යේෂණ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වල යම් ඌණ උපයෝජිත තත්ත්වයක් පැවතිය ද මෙම වර්ෂය තුළ පර්යේෂණ යෝජනා 32 ක් සඳහා පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබා දි ඇති අතර, 2015 වර්ෂය සඳහා අනුමත කරන ලද පර්යේෂණ අරමුදල් ප්‍රමාණය 31,474,596.06 කි. ඒ අනුව එය 2014 වර්ෂයට සාපේක්ෂව 300%ක වර්ධනයක් පෙන්වයි. එසේ වුවද බොහෝමයක් පර්යේෂණ වලට අදාළව රසායනික ද්‍රව්‍ය හා උපකරණ දේශිය වශයෙන් මිළදි ගැනිමේ දි වන ප්‍රමාදයන් හේතු කොට ගෙන සහ විශ්වවිද්‍යාලය තුළ අදාළ පර්යේෂණ සඳහා අවශ්‍ය උපකරණ හිඟය හේතුවෙන් පර්යේෂණ සඳහා වන ප්‍රතිපාදන ඌණ උපයෝජනයක් ඇති වී තිබේ. එමෙන්ම වෙනත් ආයතන සඳහා පර්යේෂණ කිරීමේ දි එම ආයතන වලින් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම හේතුවෙන් ද විශ්වවිද්‍යාලයට කරන ලද	2015 වර්ෂය තුළ දී පර්යේෂණ යෝජනා 32 ක් අනුමත වී තිබුණ ද, ඒවාට අදාළ වියදම් දැරීම ප්‍රධාන වශයෙන් සිදුවූයේ 2016 වර්ෂය තුලයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂය තුළ දී දැරූ මුළු පර්යේෂණ වැය රු. 7,162,475.00 ක් වූ අතර, එම වර්ෂයේ මූලික අයවැය ප්‍රතිපාදනය ද ඉක්මවා ඇත.

		ප්‍රතිපාදන භාවිතයක් සිදු නොවේ. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණක් වන පර්යේෂණ සඳහා දායක වීම ඉතා සතුටුදායක තත්ත්වයක පවතින බව සඳහන් කරනු කැමැත්තෙමි.	
(ආ)	උසස් පෙළ නව තාක්ෂණ විෂයය ධාරාවට ගැලපෙන පරිදි තාක්ෂණ උපාධි පාඨමාලාවක් ස්ථාපිත කිරීම සඳහා 2015 වර්ෂයේ දී රු. 25,000,000.00 ක අයවැය ගත මූලධන ප්‍රතිපාදන වෙන්වී තිබුණ ද රු. 745, 162.00 ක් උපයෝජනය කර තිබීමෙන් රු. 24,254,838.00 ක් එනම් වෙන්වූ ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් උපයෝජනය කර නොතිබුණි.	උසස් පෙළ නව තාක්ෂණ විෂයය ධාරාවට ගැළපෙන පරිදි තාක්ෂණ උපාධි පාඨමාලාවක් ස්ථාපිත කිරීම සඳහා 2015 වර්ෂයේ රු. 25,000,000.00 ක අයවැය ගත මූලධන ප්‍රතිපාදන වලින් උපයෝජනය කර තිබුණේ රු. 745,162.00 ක් පමණි. ඒ අනුව රු. 24,254,838.00 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර, එය ප්‍රතිපාදනයෙන් 97% ක් වූ බව සඳහන් කර ඇතිමුත්, 2015 වර්ෂය සඳහා වෙන් කරන ලද රු. මිලියන 25 ක මුදල විද්‍යාගාර උපකරණ මිළදී ගැනීම සඳහා මෙන්ම නව උපාධි පාඨමාලා වල විෂයය නිර්දේශ නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නා ලදී. විෂයය නිර්දේශ නිර්මාණය කිරීම සඳහා වැඩ මුළු කිහිපයක් සංවිධානය කළ අතර, ඒ සඳහා රු. 745,162.00 මුදල වියදම් විය. විද්‍යාගාර උපකරණ මිළදී ගැනීමට අදාළ ටෙන්ඩරය 2015 ජූලි මස කැඳවූ අතර, ඊට මාසයකට පමණ පසු මිළදී ගැනීමේ ක්‍රියාපටිපාටිය සිදුකරන ලදී. ඒ අනුව සැපයුම්කරු විසින් උපකරණ සැපයීමට මාස 03 කට අධික කාලයක් ගත වූ බැවින්, මෙම ප්‍රමාදයන් හේතුකොට ගෙන 2015 වර්ෂයේ ලැබුණු ප්‍රතිපාදන එම වර්ෂය තුළ වියදම් කිරීමට නොහැකි විය.	මේ වන විට තාක්ෂණික විෂයය ධාරාවට ලැබී ඇති අරමුදල් වලින් රු. මිලියන 50 කට ආසන්න වටිනාකමට ස්ථාවර වත්කම් මිළට ගෙන ඇති අතර, පුනරාවර්තන වියදම් සිදුවෙමින් පවතී.
(ඇ)	2014 වර්ෂයේ දී දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා 2014 දෙසැම්බර් මාසයේ විශ්වවිද්‍යාලයට ලබා දී තිබූ රු. 3,323,020.00 ක මුදල 2015 දෙසැම්බර් 31 වන විටත් නිශ්කාර්යව තිබුණ බැවින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සතුටුදායක ප්‍රගතියක් නොතිබුණි.	පටක රෝපණ විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ හා වීදුරු භාණ්ඩ මිළදි ගැනීම වෙනුවෙන් මේ වන විට රු. 1,907,312.69 වියදම් කර ඇති අතර, එය මුළු ප්‍රතිපාදනයෙන් 57% ක් පමණ වේ.	පටක රෝපණ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබා දී තිබූ රු. 3,323,020.00 ක මුදලෙන්, 2017 පෙබරවාරි 28 වන විට රු. 2,587,948.00 ක මුදලක් වැය කර තිබූ අතර, එම ඒකකය ස්ථාපිත කෙරෙමින් පවතී.

(ඇ)	2014 හා 2015 වර්ෂ වල බාහිර පාඨමාලා වලින් ඉපැයූ ආදායමින් රු. 2,000,000.00 ක පමණ මුදලක් පාඨමාලා ආරම්භ කිරීමේ කටයුතු වලට යෙදවීමකින් තොරව ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි.	2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2 ක මුදල් ශේෂයක් එම අදාල බැංකු ගිණුමේහි පැවතිය ද එම මුදල සමස්ථයක් වශයෙන් අලුතෙන් ආරම්භ කළ පරිගණක පාඨමාලාවකින් ලැබූ ලියාපදිංචි ගාස්තු හා සිසුන් විසින් කලින් ගෙවූ වාරික මුදල් වේ. දේශක ගාස්තු හා අනෙකුත් වියදම් දැරීම සඳහා මෙයින් ප්‍රමාණාත්මක ප්‍රතිශතයක් තබාගත යුතු නිසා සමස්ථ ශේෂයම ආයෝජනය කළ නොහැක. වියදම් සඳහා වෙන් කිරීමකින් පසුව ඉතිරි ශේෂය ආයෝජනය කිරීම සඳහා 2016 වර්ෂය තුළ දි කටයුතු කර ඇත.	මෙම විගණන නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ මූලික පිළිතුරු වල සඳහන් කර ඇති පරිදි, අදාළ ජංගම ගිණුමෙහි තිබූ රු. මිලියන 2 ක් වූ බාහිර පාඨමාලා මඟින් ඉපැයූ ආදයමෙන්, එම පාඨමාලා වල එදිනෙදා වියදම් සඳහා රුපියල් ලක්ෂ 05ක මුදලක් රඳවාගෙන, ඉතිරි රු. 1,500,000.00 මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත.
4.4 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්			
(අ)	2010 ජූනි 30 දින මිළදී ගත් රු. 322,560.00 ක සේප්පු 05 ක් 2015 දෙසැම්බර් 31 දිනට ද ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.	මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ විගණන කමිටු නිර්දේශය මත පරීක්ෂණයක් පවත්වා ඇති අතර, අදාළ ගිනි ආරක්ෂණ සේප්පු සම්බන්ධයෙන් කඩිනම් තීරණයක් ගනු ඇත.	අදාළ සේප්පු වල යතුරු අස්ථානගත කිරීම සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පවත්වා එකී වාර්තාව අනුව නිළධාරීන් දෙදෙනෙක් සඳහා චෝදනා පත්‍ර නිකුත් කොට විධිමත් පරීක්ෂණයක් සිදුකරමින් පවතින අතර, අස්ථාන ගත එකී යතුරු වෙනුවට අමතර යතුරු (Duplicate Keys) අදාල සැපයුම්කරුගෙන් මිළදී ගෙන එකී සේප්පු පාවිච්චියට ගැනීමට පාලක සභා අනුමැතිය ලැබී ඇත.
(ආ)	2012 වර්ෂයේ දී ඉංජිනේරු වැඩ පල සඳහා මිළදී ගත් විවිධ කාර්යයන් සඳහා භාවිතා කළ හැකි රු. 14,060,480.00 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට දැව භාවිතයෙන් සිදු කළ ප්‍රදර්ශනාත්මක කාර්යයන්ට පමණක් භාවිතා කිරීමෙන් මෙම යන්ත්‍රය ඌණ උපයෝජිතව පැවතුණි.	CNC යන්ත්‍රය විද්‍යා හා තාක්ෂණ පීඨය විසින් මිළදී ගන්නා ලද්දේ විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාවේ Mechatronics අංශයේ සිසුන්ට අවශ්‍ය CAD/CAM ප්‍රායෝගික දැනුම ලබා දීමට මෙන්ම අනෙකුත් උපාධි පාඨමාලා වල සිසුන්ට අවශ්‍ය විෂයය දැනුම ලබා දීමටය. මෙම උපකරණයෙහි ඇති මෙම උපකරණයටම ආවේණික වූ ක්‍රියාකාරිත්වයන් හා පහසුකම් විශ්වවිද්‍යාලයේ වැඩහලෙහි ඇති අනෙකුත් උපකරණයන්ගෙන් ලබාගත නොහැක. විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාවේ Mechatronics අංශයේ තෙවන වසර සිසුන්ගේ පළමු සමාසිකය තුළ මෙම උපකරණය හඳුන්වා දීමක් සිදුකරන අතර, ඒ හා සම්බන්ධ සාමාන්‍ය පරීක්ෂණයන් පමණක් සිදු කෙරේ. ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් තෙවන වසර පළමු සමාසිකය තුළ අන්තර්ගත විය. 1. CNC යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ශිෂ්‍යයයින්ට හඳුන්වා දීම. 2. CNC යන්ත්‍රය තනිව ක්‍රියාත්මක	මෙම යන්ත්‍රය දැනට අධ්‍යයන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනී.

කරවීම සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

3. කේත ක්‍රමය මගින් (Coding) යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ශිෂ්‍යය/ශිෂ්‍යයාවන් පුහුණු කරවීම.

4. දෙන ලද අක්ෂරයක් CNC යන්ත්‍රය මගින් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම.

5. සිසුන් කැමැති අක්ෂරයක් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම.

6. දෙන ලද හැඩතලයක් යන්ත්‍රය මගින් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම.

7. දෙන ලද හැඩතලයක් යන්ත්‍රය මගින් කැපීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීම.

මෙම උපකරණයේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ ගැඹුරු පාඨමාලාවන් සහ ඒ හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තෙවන වසර, දෙවන සමාසිකය හා හතරවන වසර පුරා විසිරී ඇත. මෙම උපකරණය අවසාන වසර සිසුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා විවිධ ආකාරයෙන් යොදා ගැනීම් සිදුකරනු ලැබේ.

CNC යන්ත්‍රය භාවිතය සහ අනාගත අවස්ථා

2017 වසරේ හඳුන්වා දීමට නියමිත ඉංජිනේරු තාක්ෂණවේදයේ උපාධි පාඨමාලාව හරහා ඇතුල්වන උපාධි අපේක්ෂකයින් විසින් (වසරකට සිසුන් 75 බැගින් වසර 4 ක සිසුන්) මෙම උපකරණය ඉතා පුළුල් ලෙස භාවිතා කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය විෂයය නිර්දේශ දැනටමත් නිර්මාණය කරමින් පවතී. මීට අමතරව මෙම උපකරණය ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවන් හී අදාළ සේවාවන් සම්පාදනය කිරීම සඳහා යම් මිළකට ලබාදීමට අදහස් කරමින් පවතී. එවැනි හඳුනාගත් සේවාවන් අතර,

1. Plastic manufacturing – To make mold
2. Electric switch and socket manufactures – To make mold and various metal parts
3. Rubber Manufacturing – To

		make mold, gig and fixtures 4. Automation Industry – To make various machinery parts 5. Garment industry – To make part and various attachment to the sewing machines	
(ඇ)	විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනීමට 2013 වර්ෂයේ මිළදී ගත් රු. 222,768.00 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංග ප්‍රයෝජනයට නොගෙන භාවිතයෙන් ඉවත් කර තිබුණි.	2013 වර්ෂයේ දි රු. 222,768.00 ක් ගෙවා "Tally" නම් වූ ගිණුම්කරණ මෘදුකාංගයක් මිළදී ගෙන ඇතත්, මෘදුකාංගයට අදාලව දැනුම සහ පුහුණුව ලබා දී ඇත්තේ එවකට ගිණුම් අංශයට සම්බන්ධව සිටි පුහුණුවන්නන් (Trainees) සඳහා වන අතර, මාස 06 ක පුහුණු කාලයෙන් පසු ඔවුන් පුහුණුව නිමා කොට නික්ම ගොස් ඇත. ගිණුම් අංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයක් නොමැති විම හේතුවෙන් ඉහත පුහුණුවන්නන් සඳහා මෙම මෘදුකාංග දැනුම සහ පුහුණුව ලබා දී ඇත.	මෙම විගණන නිරීක්ෂණය සඳහා සපයා ඇති මූලික පිළිතුරු වල වෙනසක් වී නැත.
4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය			
ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ අංක 08 හා 2006 ජනවාරි 25 දිනැති උපදෙස් සංග්‍රහයේ හා ICTAD SBD/01 ඡේද 33.6 අනුව ඉදිකිරීම් පිරිනැම්මෙන් පසුව සේවාදායක ආයතනය හා කොන්ත්‍රාත්කරු අතර, ලිඛිත ගිවිසුමක් ඇති කර ගත යුතු වුවත් විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) ලබා දීමේ දි ගිවිසුම් වලට එළඹ නොතිබුණි.		විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ආරම්භක අවස්ථාවේ "ගෙවීම් කරනු ලබන අගයන් සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලැබෙන තෙක් ගිවිසුම් වලට එළඹිය නොහැකිය" යන පදනමින් කොන්ත්‍රාත් ප්‍රදාන ලිපි පදනම් කරගෙන අදාල ගෙවීම් හා අනෙකුත් කටයුතු කර ඇත. නමුත් මේ වන විට කරගෙන යන සියලුම ඉදිකිරීම් කටයුතු වලට අදාල ගිවිසුම් අත්සන් කර ඇත.	ස්ථාවර ඇගයීම් කමිටු මඟින් කොන්ත්‍රාත් වලට අදාල අගයන් සඳහා අනුමැතිය ලැබුන පසු ගිවිසුම් අත්සන් කරනු ඇත. වර්තමානයේ ප්‍රදානය කරනු ලබන සියලුම කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කොට ඇත.
4.6 කාර්ය මණ්ඩල පරිපාලනය			
විශ්වවිද්‍යාලයේ පීඨයන්හි අනුමත මහාචාර්ය තනතුරු 10 ක් හා සත්ත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 180 න් 40 ක පුරප්පාඩු පැවති අතර, කළමනාකරණ පීඨයේ කථිකාචාර්යවරු 07 ක අතිරික්තයක් පැවතුණි. තවද, 2006 ජූනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 70 කට නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.		මහාචාර්යවරුන් බඳවා ගැනීම සඳහා පුවත්පත් මඟින් ඉල්ලුම්පත් කැඳවූව ද අයදුම්පත් නොලැබීම හේතුවෙන් පුරප්පාඩු පිරවිය නොහැකි වී ඇති අතර, කෙසේ වුවද අවශ්‍ය ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් බාහිර පදනම මත ගෙන්වා ගෙන අධ්‍යයන කටයුතු කරන බැව් සඳහන් කරමි. අනුමත ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු බොහෝමයක් මේ වන විට පුරවා ඇති අතර, විශ්වවිද්‍යාලයේ සියළුම පීඨයන් මඟින් පවත්වා ගෙන යන පාඨමාලා සඳහා බඳවා ගෙන ඇති ආචාර්යවරුන් හේතුවෙන් මෙවැනි තත්ත්වයන් උදාවී ඇත. කෙසේ වෙතත් කාර්යය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට ඉටුකර ඇත. අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 70 ක් පුරප්පාඩුව පවතී යන්න නිවැරදි නොවන අතර, 2015 වසරේ පුරප්පාඩුව පැවති තනතුරු අතුරින් 80% ක් පමණ 2016 වසරේ දී පුරවා ඇති බැව් සඳහන් කරමි.	අනුමත පුරප්පාඩු 80% ක් මේ වන විටත් පුරවා ඇත.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය **5.1 සංයුක්ත සැලැස්ම**		
2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය, පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මේ අන්තර්ගතව නොතිබුණු අතර, ඉටුකර ගත යුතු ඉලක්කයන්ගේ මුල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.	දැනටමත් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මාස 02 කට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, ඉදිරියේදී එම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු යොදනු ඇත.	මාස 02 කට වරක් පැවත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් වල දී සංයුක්ත සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කොට විචල්‍යයන් නිවැරදි කිරීමට කටයුතු කොට ඇත.
5.2 ක්‍රියාකාරී සැලැස්ම		
2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචිත වර්ෂයට පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි.	අදාළ විස්තර විශේෂයෙන් සංවිධාන ව්‍යුහය සංයුක්ත සැලැස්මට අතුළත් කර ඇති අතර, අනුමත කාර්යය මණ්ඩලය සහ විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.	සංවිධාන ව්‍යුහය සංයුක්ත සැලැස්මට අතුළත් කර ඇති අතර, අනුමත කාර්යය මණ්ඩලය සහ විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
5.3 අභ්‍යන්තර විගණනය		
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133(2) ප්‍රකාරව විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකරණ ලද්දේ ද යන්න තහවුරු කර ගැනීමට මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව හය මාසික අභ්‍යන්තර විගණන වාර්තා සාරාංශයක් විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී අදාළ අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් ද ඒ සමඟ එවීමට කටයුතු කරමි.	විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලත් විගණන සැලැස්මකට අනුව අභ්‍යන්තර විගණන අංශය විධිමත් අභ්‍යන්තර විගණනයක් විශ්වවිද්‍යාලයේ සියළුම අංශ ආවරණය වන පරිදි සිදු කරන ලබයි. එම විගණන විමසුම් අර්ධ වාර්ෂික වාර්තා මඟින් විගණකාධිපතිවරයා වෙත ඉදරිපත් කරයි.
5.4 ප්‍රසම්පාදන සැලැස්ම		
2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. (ඉ) හා 4.2.2. ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.	එකඟ වෙමි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (Master Procurement Plan) යාවත්කාලින කිරීමට අපොහොසත් වි ඇති අතර, ඉදිරියේදි මෙවැන්නක් සිදු නොවීමට කටයුතු කරමි.	2016 වර්ෂය සහ 2017 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැසුම් සකස් කර ඇත.
5.5 අයවැය ලේඛනමය පාලනය		
ඇස්තමේන්තු ගත වියදම් තථ්‍ය වියදම් සමග සැසදීමේ දී පුනරාවර්තන වැය විෂයයන් 05 කට වෙන් කළ ප්‍රතිපාදන වලින් සියයට 4 සිට සියයට 66 දක්වා වූ විචලනයන් හා ප්‍රාග්ධන වැය විෂයයන් 09 කට වෙන් කළ ප්‍රතිපාදන වලින් සියයට 15 සිට සියයට 97 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	එකග වෙමි. නමුත් මෙහිදි අයවැය සම්පිණ්ඩනය කිරීමේදි ඇතැම් වැය ශිර්ෂයන් සඳහා වෙන් කළ ප්‍රමාණයන් තාත්වික නොවිම මත (ඉතා වැඩි/අඩු) සත්‍ය වැය සමග සැසඳිමේ දි ප්‍රමාණාත්මක වූ විචලතාවයන් නිරීක්ෂණය වේ.	මෙම නිරීක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය නොවේ. විගණන නිරීක්ෂණය විශ්ලේෂණයක්/සාමාලෝචනයක් වේ.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද		
2012 සැප්තැම්බර් 21 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබා දුන් උපදෙස් අනුව අප ජලය ප්‍රතිචක්‍රියකරණ ව්‍යාපෘතිය පුනරුත්තාපනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත්ව තිබුණි.	අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ කටයුතු දැනටමත් අවසන් කර ඇති අතර, අදාල තත්ත්ව පාලන වාර්තාවක් ද ලබා ගෙන ඇත.	අදාල ව්‍යාපෘතියේ කටයුතු අවසන් කොට තත්ත්ව පාලන වාර්තාවක් ලබා ගෙන ඇත.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙත වරින්වර දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය නොකිරීම. ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳුනු ගිණුම් පැවතීම.
(ආ)	වත්කම් කළමනාකරණය	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම.
(ඇ)	ගබඩා පාලනය	දුර්වල තොග කළමනාකරණය. තොග මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් නොකිරීම.
(ඈ)	කාර්යය මණ්ඩල පරිපාලනය	තනතුරු පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම.
(ඉ)	කාර්යය සාධනය	අපේක්ෂිත අරමුණු කරා ළඟා නොවීම.
(ඊ)	අයවැය ලේඛනමය පාලනය	ඇස්තමේන්තු හා සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම.